# කාර්යසාධන හා වාර්ෂික ගිණුම් වාර්තාව - 2015
# செயற்திறன் அறிக்கை மற்றும் ஆண்டுக் கணக்குகள் - 2015
# Performance Report and Annual Accounts - 2015




## දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කිළිනොච්චිය
## மாவட்ட செயலகம் - கிளிநொச்சி
## District Secretariat - Kilinochchi

පටුන පිටු අංකය


1. දිසාපතිතුමාගේ පණිවිඩය.....01

2. කිළිනොච්චි දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හඳුන්වා දීම.....02

2.1 දැක්ම හා අපේක්ෂිත මෙහෙවර.....02

2.2 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අරමුණු හා කාර්යභාරය.....03

3. කිළිනොච්චි දිස්ත්‍රික්කය හැඳින්වීම.....04

3.1 පරිපාලන මායිම්.....04

3.2 ඓතිහාසික වැදගත්කම්.....04

3.3 ස්වභාවික සම්පත්.....05

3.4 වෙළඳ ආර්ථික කටයුතු.....05

3.5 වාරිමාර්ග ක්‍රමයන්.....06

3.6 ජනගහණ තොරතුරු.....09

3.7 වර්ෂාපතන තත්වය.....10

3.8 දිස්ත්‍රික්කයේ මූලික සංඛ්‍යා ලේඛණ තොරතුරු.....11

4 .ආයතන ව්‍යුහය සහ අනුමත කාර්යමණ්ඩල තොරතුරු.....12

4.1 ආයතන සංවිධාන සිතියම.....12

4.2 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අනුමත කාර්ය මණ්ඩල තොරතුරු.....13

5. කාර්ය සාධනය.....15

5.1රාජ්‍ය පරිපාලන කටයුතු වල ප්‍රගතිය.....15

5.1.1 පරිපාලන අංශයේ කටයුතු.....15

5.1.2 අභ්‍යන්තර විගණන කටයුතු.....16

5.1.3 ආදායම් රැස් කිරීමේ කටයුතු.....17

5.1.4 මිනිස්බල හා රැකිරක්ෂා දෙපාර්තමේන්තුවේ කටයුතු.....18

5.1.5. මැතිවරණ දෙපාර්තමේන්තුවේ කටයුතු.....20

5.1.6. දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ කටයුතු.....22

5.1.7 ආපදා කළමනාකරණ කටයුතු.....23

5.1.8 මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ කටයුතු.....28

5.1.9 විශ්‍රාම වැටුප් කටයුතු.....29

5.1.10 සංගණන හා සංඛ්‍යා ලේඛණ දෙපාර්තමේන්තුවේ කටයුතු.....30

5.1.11 මධ්‍යම පරිසර අධිකාර සභාවේ කටයුතු.....31

5.1.12 ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ කටයුතු.....33

5.1.13 දිස්ත්‍රික් පුහුණු මධ්‍යස්ථානයේ කටයුතු.............................................................. 37

5.1.14 විමර්ශන අංශයේ කටයුතු....................................................................................39

5.1.15 ඵලදායිතා ප්‍රවර්ධන අංශයේ කටයුතු .................................................................40

5.1.16 ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැළසුම් දෙපාර්තමේන්තුවේ කටයුතු............................41

5.2 සමාජ සේවා හා සංස්කෘතික ප්‍රවර්ධනය.......................................................................42

5.2.1 සංස්කෘතික අංශයේ  කටයුතු...................................................................................42

5.2.2 මුල් ළමාවිය සංවර්ධන අංශයේ කටයුතු...............................................................45

5.2.3 ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ කටයුතු...........................................................47

5.2.4 උපදේශන කටයුතු..................................................................................................48

5.2.5 කාන්තා සංවර්ධනය සැබැඳ කටයුතු......................................................................49

5.2.6 සමාජ සේවා කටයුතු................................................................................................52

5.2.7දිස්ත්‍රික් ක්‍රීඩා සංවර්ධන කටයුතු...............................................................................57

5.3 දිස්ත්‍රික් සංවර්ධන කටයුතු.............................................................................................58

5.3.1 දිස්ත්‍රික් සැළසුම් කටයුතු .......................................................................................58

5.3.2 පුනරුත්ථාපන අධිකාර සභාවේ කටයුතු .................................................................67

5.3.3 ලෝක ආහාර සැළසුම් කටයුතු ................................................................................72

5.3.4 ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේ කටයුතු..........................................................72

5.3.5 රැකිරක්ෂා දෙපාර්තමේන්තුවේ කටයුතු..................................................................77

5.3.6 දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ කටයුතු ..................................................79

5.3.7 දිස්ත්‍රික් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කටයුතු........................................................ 85

5.3.8 අනෙකුතු දෙපාර්තමේන්තු යටතේ ඇති ගිණුම් කටයුතු...........................................90

5.4 වාර්ෂික ගිණුම්...........................................................................................................92

# 1.

## 1.1දිසාපතිතුමාගේ පණිවිඩය.



කිලිනොච්චි දිස්ත්‍රික්කයේ සමාජ ආර්ථික සංවර්ධනය වනාහි ගතවූ වර්ෂයන් සමඟ සසඳන විට දැනට තව තවත් වැඩියෙන් ඉහළ ගොස් ඇති බව සංඛ්‍යා ලේඛණ තොරතුරු මත තහවුරු කර ගත හැකි වේ. කිලිනොච්චි දිස්ත්‍රික්කයේ දැක්ම ඉලක්ක කර ගනිමින් සැළසුම් කරන ලද ව්‍යාපෘතීන් ප්‍රාදේශිය ලේකම් කාර්යාල හා අනෙක් දෙපාර්තමේන්තුවල ද සහයෝගයෙන් ඵලදායිතාවයෙන් යුතුව ඉටු කරනු ලබන්නේය. එය මූලිකව ගෙන දිස්ත්‍රික්කයේ සමාජ ආර්ථික සංවර්ධනය දෙස බැලීමේ දී කාර්යක්ෂමතාවය හා ඵලදායිතාවයෙන් යුතු සංවර්ධන ව්‍යාපෘතීන් කිහිපයක් ම ක්‍රියාත්මක කර තිබේ.

භූමි සම්පත හා ජල සම්පතෙන් සපිරි කිලිනොච්චි දිස්ත්‍රික්කයේ ප්‍රධාන රැකියාව ගොවිතැනයි. මෙම කෘෂි නිෂ්පාදනය වන වී වගාව යල හා මහ කන්නවල දී විශාල අස්වැන්නක් ලබා ගත් අතර ධාන්‍ය වගාව, කිරි හා ආශ්‍රිත ද්‍රව්‍ය නිෂ්පාදන, පොල් වගාව හා කුඩා කර්මාන්ත ආදියෙහි දියුණුව ඉහළ ගොස් ඇති බව දැක ගත හැකිය.

යටිතල පහසුකම් පිළිබඳව බැලීමේ දී ගෙයින් ගෙට ගමින් ගමට වැඩසටහන, දිවිනැගුම මූල්‍ය ප්‍රතිපාදන ආදිය යටතේ සැළකිය යුතු මාර්ග අලුත්වැඩියා කර ඇති අතර කුඩා පාලම් සෑදීම පාසැල්වල යටිතල පහසුකම් වැඩසටහන් ප්‍රජා ශාලාවන් ඉදි කිරීම ග්‍රාමීය සෞඛ්‍ය මධ්‍යස්ථාන පුනරුත්ථාපනය කිරීම ආදිය ක්‍රියාත්මක කරනු ලැබුවේ ය. තවද 90% ක ජනතාවට විදුලි ලබා දීම දෙස බැලීමේ දී කිලිනොච්චි දිස්ත්‍රික්කය වනාහි යහපත් සංවර්ධයක් ලබා ඇති බව නිරීක්ෂණය වේ.

ඒ අනුව කිලිනොච්චි දිස්ත්‍රික්කයේ සංවර්ධනය හා පරිපාලනයේ කාර්යක්ෂමතාවය ද හුවා දැක්වීමේ අරමුණෙන් 2015 වර්ෂයේ කාර්ය සාධන හා වාර්ෂික ගිණුම් වාර්තා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් මා ඉතාමත් ආඩම්බරයට හා සතුටට ද පත් වන්නෙමි.

සුන්දරම් අරුමෛනායගම් මහතා
දිස්ත්‍රික් ලේකම්
කිලිනොච්චි දිස්ත්‍රික්කය

## 2. කිළිනොච්චි දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හඳුන්වා දීම.

යාපනය දිස්ත්‍රික්කය සමග ඒකාබද්ධව තිබූ කිළිනොච්චි ප්‍රදේශය තනි දිස්ත්‍රික්කයක් ලෙස 1984 වන වර්ෂයේ ස්ථාපිත කරන ලදි. කිළිනොච්චිය කරඩිපෝක්කු හන්දියේ තිබෙන වී අලෙවි මණ්ඩලයට අයත් ගොඩනැගිල්ලේ ආරම්භ කර පසුව ඒ 9 පාරේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ඉදිකර එහි කාර්යාල කටයුතු ක්‍රියාත්මක වෙමින් පැවතුනේය. මෙය පසුගිය 2014 වර්ෂයේ නව ගොඩනැගිල්ලක ස්ථාපිත කොට පවත්වාගෙන යන්නනේ ය.

මෙම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කටයුතු සඳහා කරච්චි, කණ්ඩාවලෙ, පච්චිලෙපල්ලි, පූනකරි වන ප්‍රාදේශීය ලේකම් කර්යාල හතරක් පිහිටුවා කාර්යාල කටයුතු පහසුවෙන් කරගෙන යමින් පවතී.

### 2.1 දැක්ම හා අපේක්ෂිත මෙහෙවර

**දැක්ම**

නවීකරණය කරන ලද දිස්ත්‍රික් පරිපාලනය හරහා කාර්යක්ෂමතාවයෙන් යුතු මහජන සේවාවක් ලබා දීම.

**මෙහෙවර**

රාජ්‍ය ප්‍රතිපත්තිවලට අනුව කාර්යක්ෂමතාවය උපයෝගි කර ගනිමින් සතුටුදායක සම්බන්ධීකරණයක් මඟින් දිස්ත්‍රික්කයේ සංවර්ධනය, සමාජ හා සංස්කෘතික පැවැත්ම ප්‍රවර්ධනනය කිරීම.

**දිස්ත්‍රික් ලේකම් කාර්යලයේ අරමුණු**

1. නව නිමැවුම් හඳුන්වා දීම.
2. කාර්යක්ෂමතාවයෙන් යුතු සේවාවක් ලබා දීම.
3. ග්‍රාමීම මට්ටමේ ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම
4. සංස්කෘතික සිරිත් විරිත් පෞරාණිකත්වය සුරැකීම.
5. ප්‍රාදේශීය හා ග්‍රාමීය මට්ටමේ සම්බන්ධීකරණය.

## 2.2 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අරමුණු හා කාර්යභාරය.

- **කාර්යක්ෂමතාවයෙන් යුතු දිස්ත්‍රික් පරිපාලන ක්‍රමය.**
  - දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල අතර පරිගණක ජාල සම්බන්ධ කිරීම හා අභ්‍යන්තර හා භාහිර වශයෙන් ද සම්බන්ධ කර කටයුතු සිදුකිරීම.
  - සේවකයන් සම්බන්ධව පුද්ගලික ලිපිගොණු, වැටුප්, වෙනත් ගෙවීම්, දුම්රිය ගමන් බලපත්‍ර, නිළධාරීන් සඳහා අවශ්‍ය පුහුණුවීම්.
  - විශ්‍රාමිකයන් සඳහා විශ්‍රාම වැටුප් ගෙවීම.
- **පොදු ජනතාව සඳහා සේවය ලබා දීම හා එකී සේවා අදාළ ආයතවලින් පහසුවෙන් ලබා ගැනීම සඳහා කටයුතු සිදු කිරීම.**
  - හැදුණුම්පත් ලබා දීම, මෝටර් රථ වාහන බද්ධ, ව්‍යාපාර අවසර පත්‍ර ලබා දීම.
  - උප්පැන්න, මරණ සහතික හා විවාහ සහතික ලබා දීම.
  - රියදුරු බලපත්‍ර හා මාර්ග ප්‍රවාහන බලපත්‍ර ලබා දීම.
  - ඉඩම් ඔප්පු සහ බලපත්‍ර ලබා දීම විධිමත් කිරීම සහ ඉඩම් ගැටළු විසදීම.
- **කලා සංස්කෘතික කටයුතු උත්සව පැවැත්වීම සහ දිස්ත්‍රික් හා ජාතික තලයේ වැඩ සටහන්.**
  - **සංස්කෘතික සිරිත් විරිත් හා ශාරීරික හා මානසික යහ පැවැත්ම.**
  - කලා හා සංස්කෘතික උත්සව පැවැත්වීම කලාව හා සංස්කෘතිය හා සබැඳි තරඟ පැවැත්වීම.
  - සංස්කෘතිය හා සබැඳි ක්‍රීඩා උත්සව පැවැත්වීම.
  - දිස්ත්‍රික් ක්‍රීඩා උත්සව හා ආබාධිත අයවලුන් සඳහා වන ක්‍රීඩා උත්සව පැවැත්වීම.
  - යහපත් පුරවැසියන් බිහි කිරීමට හැකිවන සේ ළමුන් හා තරුණයින්හට දැනුවත් කිරීමේ වැඩමුළු පැවැත්වීම. උපදේශන ප්‍රවර්ධන වැඩ සටහන් පැවැත්වීම.
- **ග්‍රාමීය හා ප්‍රාදේශීය මට්ටමේ සිටින ජනතාවගේ අධ්‍යාපන සෞඛ්‍ය හා කෘෂිකර්ම ආදියට උපකාර කරන අතර දිළිඳු මට්ටම තුළ සිටින අයවලුන්ට සහනාධාර හා ජීවනාධාර උපකාර ලබා දීම.**

  - කාන්තා මූලිකත්වය දරණ පවුල්වලට ස්වයංරැකියා පුහුණු ලබා දීම හා දිරි දීමනා ලබා දීම.
  - වැඩිහිටියන්හට හා ආබාධිත අයවලුන්හට විශේෂ රෝගී තත්වයේ අයවලුන්හට දීමනා ලබා දීම.
  - ආපදා කළමනාකරණ සේවා අංශය විසින් ග්‍රාමීය මට්ටමේ හදිසි ආපදා හා සබැඳි දැනුවත් කිරීමේ වැඩමුළු පැවැත්වීම එම අවස්ථාවේදී ම ආපදා සහන සේවාවන් ක්‍රියාත්මක කිරීම.
  - ඡන්දදායක ලැයිස්ත්‍ර නාම ලේඛණ ලියාපදිංචිය හා මැතිවරණ සම්බන්ධීකරණය.

- ගොවියන්හට අවශය බීජ, කෘෂි ද්‍රව්‍ය හා කෘෂි උපකරණ ලබා දීම.
- මාර්ග සංවර්ධන, වාරිමාර්ග, විදුලි පහසුකම් සංවිධානය කිරීම නිවාස යෝජනා ව්‍යාපෘත් කටයුතු සැකසීම හා යුද්ධයෙන් පීඩාවට පත්වූ අයවලුන්හට වන්දි මුදල් ලබා දීම හා දිස්ත්‍රික්යේ සියළුම සංවර්ධන වැඩ සටහන් සංවිධානය කර නියාමනය කිරීම.

## 3. කිළිනොච්චි දිස්ත්‍රික්කය හැදින්වීම.




### 3.1 පරිපාලන මායිම්.

උතුරු පළාතේ මධ්‍යම ප්‍රදේශයේ පිහිටා ඇති කිළිනොච්චි දිස්ත්‍රිකය උතුරු දිශාවෙන් යාපනය දිස්ත්‍රික්කය ද නැගෙනහිරට හා දකුණෙන් මුලතිව් දිස්ත්‍රික්කය ද බස්නාහිරින් හා දකුණින් මන්නාරම් දිස්ත්‍රික්කය ද වශයෙන් පිහිටා ඇත.

### 3.2 ඓතිහාසික වැදගත්කම්.

ශ්‍රී ලංකාවේ පළමුවන මානව ජනාවාසයේ ආරම්භ තිත ලෙස ඉරණමඩු ප්‍රදේශය හඳුනා ගැනීම මඟින් කිළිනොච්චියේ ඓතිහාසික පෞරාණිකත්වය ආරම්භ වේ. එම කාලවකවානුවේ ජීවත් වූ ජනතාව කෘෂිකර්මය , දඩයම් කිරීම, ධීවර රැකියාව, ධාන්‍ය ගබඩා කිරීම සිදු කර ඇත. මෙම දිස්ත්‍රික්කයේ දක්නට

ඇති ඉරණමඩු වැව ඇතුළු මහා වාරිමාර්ග වැව් අටක් ද කුඩා වාරිමාර්ග වැව් 312ක් ද මෙම දිස්ත්‍රික්කයේ පිහිටා තිබීම තුළින් මෙහි ජනතාවන්ගේ රැකියා ක්‍රමයන් කියාපායි. වතද තාක්ෂණය හා කලාත්මකභාවයෙන් යුතු ජන සමූහයක් ජීවත් වූ බව විශ්වාස කරනු ලබයි.

ඓතිහාසික වැදගත්කමකින් යුතු උරුත්තිරපුරම් ශිවන් කෝවිල, පුලියම්පොක්කනෙ නාගතම්බිරාන් කෝවිල, මන්නිත්තලෙයි ශුද්ධ වූ අන්තෝනි මුනිදු කිතුණු දේවස්ථානය, පාලයිතිවු ශුද්ධ වූ අන්තෝනි මුනිදු දේවස්ථානය පොන්නාවේලි ශිවන් කෝවිල, හා පූනකරි ඕලන්ද කොටුව ආදිය සැලකේ.

## 3.3 ස්වභාවික සම්පත්.

ස්වභාවික සම්පත් වන ඉරණමඩු වැව, චුණ්ඩික්කුලම පක්ෂි අභය භූමිය, වන්නේරිකුලම් පක්ෂි අභය භූමිය සහ කෞදාරිමුනායි මුහුදු වෙරළ ආදිය පිහිටා ඇත.

## 3.4 වෙළඳ ආර්ථික කටයුතු

මෙම දිස්ත්‍රික්කයේ ප්‍රධාන රැකියාව කෘෂිකර්මාන්තය වේ. බහුතරයක් වී ගොවිතැනෙහි නිරත ව සිටින අතර, අනෙක් පිරිස් උප ආහාර භෝග වගාව, පළතුරු වගාව, සත්ව පාලනය, ධීවර කර්මාන්තයේ ද යෙදී සිටිති.

**මේ අයුරෙන් කිලිනොච්චි දිස්ත්‍රික්කයේ නිෂ්පාදන ක්‍රියාදමයන් මෙසේය.**

**කිළිනොච්චි දිස්ත්‍රික්කයේ නිෂ්පාදන ක්‍රියාදාමයන්**

| භෝග | භෝග වගා ව්‍යාපෘතිය. (හෙ) | | නිෂ්පාධනය (මෙ.ටො.) | |
|---|---|---|---|---|
| | මහ කන්නය (2014,2015) | යල කන්නය 2015 | මහ කන්නය (2014,2015) | යල කන්නය 2015 |
| වී | 18247 | 6781 | 63864 | 32209 |
| එළවළු | 698 | 360 | 5584 | 4998 |
| මිරිස් | 223 | 62 | 123 | 93 |
| රතුළූණු | 86.5 | 43 | 865 | 516 |
| මුං | 196 | 160 | 196 | 160 |
| උදු | 195.5 | 1.5 | 195 | 2 |
| කවුපි | 151 | 56 | 120 | 72 |
| රටකජු | 344 | 125.5 | 554 | 165 |
| **එකතුව** | **20141** | **7589** | **71501** | **38215** |

| නිෂ්පාධනය කරන ලද පළතුරු වර්ග | වගා කරන ලද වපසරිය (හෙක්ටයර්) | නිෂ්පාධනය (මෙ.ටො.) |
|---|---|---|
| කෙසෙල් | 185 | 2,775 |
| පැපොල් | 30 | 240 |
| අඹ | 182 | 1,092 |
| දොඩම් | 5 | 238 |
| දෙහි | 34 | 238 |
| කොස් | 108 | 1,620 |
| එකතුව | **554** | **6,203** |

## 3.5 වාරිමාර්ග ක්‍රමයන්

උතුරු පළාත් දිස්ත්‍රික්කයේ ප්‍රමුඛත්වයක් ලබා දිය හැකි කෘෂිකර්ම දිස්ත්‍රික්කයක් ලෙස කිළිනොච්චි දිස්ත්‍රික්කය පවතී.
මෙම දිස්ත්‍රික්කය දළ වශයෙන් වර්ග කිලෝ මීටර් 1237.11 බිම් කොටසකින් ද, වර්ග කිලෝ මීටර් 44.3 ක අභ්‍යන්තර ජල ප්‍රදේශයන්ගෙන් ද සමන්විත ව පිහිටා තිබේ. සාමාන්‍යයෙන් උෂ්ණත්වය අධික ප්‍රදේශයක් ලෙස දක්නට ඇති නමුත් මෙහි සශ්‍රීක වැව් හා එයට අයත් වාරිමාර්ග ව්‍යාපෘති ආධාරයෙන් ජලය ලබා ගොවිතැනෙහි විශාල අස්වනු ලබා ගත හැකි දිස්ත්‍රික්කයක් ලෙස කිළිනොච්චිය ද තැනක් හිමි කරගෙන ඇති බව සඳහන් කළ යුතු ය. මෙහි ප්‍රධාන වශයෙන් සලකා බැලීමේදී වැව් ජලය උපයෝගී කර ගනිමින් (අක්.අඩි 2) අධික අස්වැන්නක් ලබා දෙන වාරිමාර්ගයක් ලෙස ඉරණමඩු වාරිමාර්ග ව්‍යාපෘතිය ජාතික වශයෙන් පිළිගැනීම මත කිළිනොච්චි දිස්ත්‍රික්කය ද කෘෂිකර්ම දිස්ත්‍රික්කයක් ලෙස හඳුන්වා දී ඇත. මෙහි ඔය මං 7ක් දක්නට ඇත.

| **ඔය මාර්ගයේ නම** | **ජලය ලැබෙන ප්‍රදේශ** |
|---|---|
| කලකලප්පාරු | පුදුමුරිප්පුකුලම් |
| පිරමන්දනාරු | පිරමන්දනාරුකුලම් |
| කනගරායන්ආරු | ඉරණයිමඩුකුලම් |
| නෙත්තලිආරු | කල්මඩුකුලම් |
| පල්ලවරායන්කට්ටු | කරියාලයි නාගපඩුවාන් |
| මණ්ඩක්කල්ආරු | වන්නේරික්කුලම් |
| අක්කරායන්ආරු | අක්කරායන්කුලම් |

විශාල වැව් සතරක් ආශ්‍රිත වාරිමාර්ග ව්‍යාපෘති ද මධ්‍ය ප්‍රමාණයේ වැව් පහක් ආශ්‍රිත වාරිමාර්ග ව්‍යාපෘති ද මෙම දිස්ත්‍රික්කයේ දක්නට තිබේ. ඉරණයිමඩු , කල්මඩු , අක්කරායන්, කරියාලයි නාගපඩුවාන් ආදී විශාල වැව් වලින් ද කනගාම්බිහෙයි, පුදුමුරිප්පු, පිරමන්දනාරු, වන්නේරි කුඩා මුරුට් ආදි මධ්‍ය ප්‍රමාණයේ

වැව්වල වාරිමාර්ග ව්‍යාපෘතීන් ක්‍රියාත්මකව පවතියි. මේ සියල්ල උතුරු වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් කළමණාකරණය කර අධීක්ෂණය කරනු ලබයි.

| අනු අංකය | වැවේ නම | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ජලය ලැබෙන ඔය මාර්ගය | ජලය රදවනා වපසරිය (වර්ග සැතපුම්) | වපසරිය (අක්.අඩි) | ජලය ලබා දෙන වපසරිය (අක්) |
|---|---|---|---|---|---|---|
| 01 | ඉරණමඩු | කරච්චි | කනගරායන්ආරු | 227.00 | 106,500 | 21,985 |
| 02 | කනහාම්බිහයි | කරච්චි | කනගරායන්ආරු | 10.30 | 1,221 | 260 |
| 03 | පුදුමුරිප්පු | කරච්චි | කලකලප්පුආරු | 10.50 | 2,957 | 1,135 |
| 04 | අක්කරායන් | කරච්චි | අක්කරායන්ආරු | 41.20 | 21,200 | 3,417 |
| 05 | වන්නේරිකුලම් | කරච්චි | මන්ඩකල්ලාරු | 5.00 | 1,713 | 346 |
| 06 | කල්මඩු | කණ්ඩාවලෙයි | නෙත්තලිආරු | 26.50 | 9,152 | 4,425 |
| 07 | පිරමන්දනාරු | කණ්ඩාවලෙයි | පිරමන්දනාරු | 25.89 | 3,128 | 602 |
| 08 | කරියාලයි නාගපඩුවාන් | පූනකරි | පල්ලවරායන්කට්ටු | 46.00 | 11,791 | 1,505 |
| 09 | කුඩාමුරුට්ටි | පූනකරි | අක්කරායන්ආරු | 8.30 | 9,600 | 1,300 |

කිළිනොච්චි දිස්ත්‍රික්කයේ වාරිමාර්ග හා කෘෂිකර්ම වර්ධනය සලකා බැලීමේ දී, ඉරණමඩු වැව හා වාරිමාර්ග ව්‍යාපෘතිය ද ප්‍රධාන තැනක් ගන්නා අතර කිළිනොච්චියේ ජීවත් වන ජනතාවගේ ප්‍රාණය ලෙස ද පවතී. දිස්ත්‍රික්කයේ 21208 ක ගොවි පවුල්වලින් 9495 ක් ඉරණමඩු ව්‍යාපෘතිය යටතේ ගොවිතැන් කටයුතු වල නිරත වන අයවලුන් වන අතර මෙය දිස්ත්‍රික්කයේ සම්පූර්ණ ගොවිපවුල් සංඛ්‍යාවෙන් 40% ක් වේ. තව ද ඉරණමඩු වාරිමාර්ග ව්‍යාපෘතියේ වී වගාව පමණක් නොව උප ධාන්‍ය වගාවන් වන කවුපි, උඳු, මුං වැනි දෑ ද වගා කර කෘෂිකර්මයෙන් සපිරි ස්ථානය කරා ගෙනයමින් කිළිනොච්චි දිස්ත්‍රික්කය දියුණු මාර්ගයක ගමන් කිරීම දැක ගත හැකි ව තිබේ. තව ද වැව් 394ක් ගොවි ජන සේවා දෙපාර්තමේන්තුව විසින් නඩත්තු කරමින් පවතී. තවද ලුණු ජලය හරස් කොට බැමි සැළසුම් පූනකරි ප්‍රදේශයේ දක්නට ලැබේ. මේ හේතුවෙන් මුහුදු වතුර ඇතුල් වීම වලක්වා ඇති අතර ගංවතුර ඇතුල් විම වැලැක්වීම සඳහා ඉදි කර ඇත. මෙම සැළසුම් සම්පූර්ණව පහුගිය වසර 30 ඇතුළත අප ප්‍රදේශයේ පැවැතුන අසාධාරණ තත්වයේ දී විශාල හානි තත්වයක තිබූ බව දක්නට ලැබිණි.

නමුත් නැවත පදිංචියෙන් පසු පොදු ජනතාවගේ ජීවන තත්ත්වය සහතික කිරීම සඳහා ව්‍යාපෘතීන් කීපයක් ම මිලියන ගණනක් ආයෝජන කර ප්‍රතිසංස්කරණය කරමින් පවතියි. මේ මගින් ගොවිපවුල් 10,615කට අක්කර 33,550 ගොවිබිම් ප්‍රයෝජනයට ගත හැකි ව තිබේ.




කල්මඩුකුලම නැවත ඉදිකිරීම ක්‍රියාත්මක කළ ව්‍යාපෘතීන් අතර ප්‍රමඛස්ථානයක් ලබා ගනී. ඈඩි යුද්ධය පැවති කාල වකවානුවේ 2009 වන වර්ෂයේ කඩා දමන ලද වැවේ නැවත ඉදි කිරීමේ කටයුතු 2010 වසරේ ආරම්භ කරමින් රුපියල් මිලියන 115ක් වැය කරමින් 2011 වර්ෂයේ ප්‍රතිලාභී පවුල් 1025ක් ඵලදායිතාවය ලබා ගන්නා අයුරෙන් මෙම ව්‍යාපෘතිය පුනරුත්ථාපනය කරණු ලැබුවේ ය. 2012 වර්ෂයේ ම මෙම වැවට ජලය පුරවා එම වසරේ මහ කන්නයේ අක්කර 4250 පමණ වගා කරමින් නැවත පදිංචි කිරීමේ කටයුතු සඳහා තව තවත් ශක්තියක් ලබා දුන්නේ ය. දැනට කන්න දෙකෙහි ම ගොවිතැන් කටයුතු වල වගා කිරීමට හැකි තත්ත්වයක් දක්නට තිබේ.

මෙලෙස පුදුමුරිප්පු කුලම, පිරමන්දනාරු කුලම, කරියාලෛ නාගපඩුවාන්, වන්නේරිකුලම හා අක්කරායන්කුලම ආදී වැව්ද රාජ්‍ය හා විදේශ මූල්‍ය ආයතන මඟින් ද පුනරුත්ථාපනය කර එහි ඵලදායීතාවය ජනතාව ලබා ගනිමින් සිටිති.

ඉරණමඩුකුලම ද නැවත පදිංචියේ දී රජයේ මූල්‍යාධාර යටතේ 2010 වර්ෂයේ සිට සංවර්ධන කටයුතු කරගෙන යනු ලැබුවේ ය. නමුත් 2012 වර්ෂයේ සිට වැ පාවුල්ලේ ඇති ඇළවල් හා මාර්ග ආදිය IFAD නමැති ආයතනයේ ලිහිල් ණය යටතේ පුනරුත්ථාපනය කර ගෙන යනු ලබයි. එමඟින් නවීන ජල

කළමනාකරණය පවත්වා අධික වූ අස්වැන්නක් ලබා ගැනීමේ අවස්ථාව එළඹී තිබේ. තව ද කෘෂිකර්ම කටයුතු ප්‍රවර්ධනය කිරීමටත් වගා බිම්වල විකල්ප භෝග වගාවන් කිරීමටත් කටයුතු කරනු ලබයි. මෙම වෙනස ගොවි ජනතාවන්ගේ ජීවන තත්ත්වය සැළකිය යුතු ප්‍රමාණයක ඉහළ නැංවීමට රුකුලක් වී තිබේ.

තව ද වැව ඉදි කිරීමේ කටයුතු සංවර්ධනය කිරීමට ආසියානු සංවර්ධන බැංකුවේ ලිහිල් ණය මඟින් පවතින වර්ෂයේ සිට සංවර්ධන කටයුතු රාශියක් කිරීමට නියමිත ය. මෙමඟින් අතිරේක ජලය රැස් කිරීමේ අවස්ථාවක් ද ඇති වී තිබෙනවා.

කිලිනොච්චි දිස්ත්‍රික්කයේ සංවර්ධනය වනාහි වාරිමාර්ග ව්‍යාපෘතීන් මඟින් ශක්තිමත් වන බව සියළුම අයවලුන් පිළිගනිති. දිස්ත්‍රික්කය හරහා ගලා යන ජන සම්පත මුහුදට යාමට නොදී සංරක්ෂණය කරන අතර මුහුදු ජලයේ ජල සම්පත දූෂණය නොවන අයුරෙන් ආරක්ෂා කිරීමේ මහඟු වගකීමක් වාර්මාර්ග දෙපාර්තමේන්තුව සතුය. එම දෙපාර්තමේන්තුවේ වැඩ සටහන් ක්‍රියාත්මක කර දීර්ඝ කාලයක් පැවතිය හැකි අයුරෙන් හා දැඩි ලෙස පීඩාවට පත් වූ මෙම ජනතාවට ප්‍රයෝජන ලබා ගත හැකි අයුරෙන් සියළුම ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීමෙන් අපගේ දෙපාර්තමේන්තුවට ආඩම්බරයක් එක්කරයි. ජල සම්පත ආරක්ෂා කිරීමේ උත්සහයන් වාරිමාර්ග දෙපාර්තමේන්තුව තම සීමාව තුළ ක්‍රියාත්මක කර මෙම දිස්ත්‍රික්කයේ ජනතාව හට කල් පවතින නොයෙක් ව්‍යාපෘතීන් හඳුනාගෙන සංවර්ධනය කර ගෙන යන බව ආඩම්බරයෙන් යුතුව ප්‍රකාශ කිරීමට කැමැත්තෙමි.

### 3.6 ජනගහණ තොරතුරු

| අංක | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | පවුල් සංඛ්‍යාව | පුද්ගලයින්ගේ එකතුව | පිරිමි | ගැහැණු | දෙමළ | සිංහල | මුස්ලිම් |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | කරච්චි | 22,975 | 75,468 | 36,667 | 38,801 | 22,681 | 21 | 273 |
| 2 | කණ්ඩාවලෛ | 8,046 | 25,481 | 12,271 | 13,210 | 8,038 | | 8 |
| 3 | පූනකරි | 7,214 | 25,566 | 12,668 | 12,898 | 6,757 | 1 | 456 |
| 4 | පච්චිලෛපල්ලි | 3,658 | 11,998 | 5,808 | 6,190 | 3,654 | 2 | 2 |
| එකතුව | | **41,893** | **138,513** | **67,414** | **71,099** | **41,130** | **24** | **739** |

## 3.7. වර්ෂාපතන තත්වය

කිලිනොච්චි දිස්ත්‍රික්කයේ ශීතෝෂ්ණ තත්වය මෝසම් සුළඟ විසින් නිර්ණය කරනු ලබයි. ඊශානදිග මෝසම් සුළඟ හේතුවෙන් ප්‍රධාන වර්ෂ කාලය ලෙස ඔක්තෝබර් මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා ද නිරිතදිග මෝසම් සුළඟ හේතුවෙන් සුළු වැසි කාලයන් ලෙස අප්‍රේල හා මැයි මාසයන්වල කාලයද සළකනු ලැබේ. දළ වශයෙන් වාර්ෂික වර්ෂාපතනය මිලි මීටර 2098 ක් ද දළ වශයෙන් උෂ්ණත්වය සෙල්සියස් $23^0$ සිට $31^0$ දක්වා දක්නට තිබේ.

මෙම දිස්ත්‍රික්කය වනාහි වියළි දිස්ත්‍රික්කයක් ලෙස දක්නට ඇති නමුත් ජලය රඳවා තැබිය හැකි අයුරෙන් වැව් දක්නට ඇති හෙයින් අධික වශයෙන් කෘෂිකර්ම කටයුතු වැව් ජලය ලබා ගනිමින් හා ළිං ජලය ලබා ගනිමින් ජනතාව තම ජල අවශ්‍යතාවයන් සපුරා ගනිති.

**වර්ෂාපතනය**

| අංකය | මාස | වර්ෂාපතනය (මිලි මීටර්) |
|---|---|---|
| 01 | ජනවාරි | 1.5 |
| 02 | පෙබරවාරි | 88.1 |
| 03 | මාර්තු | 90.6 |
| 04 | අප්රේල් | 110.3 |
| 05 | මැයි | 123.3 |
| 06 | ජුනි | 165.1 |
| 07 | ජූලි | 0 |
| 08 | අගෝස්තු | 86.2 |
| 09 | සැප්තැම්බර් | 162.6 |
| 10 | ඔක්තෝබර් | 173.8 |
| 11 | නොවැම්බර් | 660.8 |
| 12 | දෙසැම්බර් | 435.7 |
| එකතුව | | 2098 |

උෂ්ණත්වය

| අංකය | මාස | අවම උෂ්ණත්වය (සෙල්සියස්) | උපරිම උෂ්ණත්වය (සෙල්සියස්) |
|---|---|---|---|
| 01 | ජනවාරි | 18.85 | 29.45 |
| 02 | පෙබරවාරි | 26.11 | 23.43 |
| 03 | මාර්තු | 23.5 | 32.3 |
| 04 | අප්‍රේල් | 24.5 | 33.3 |
| 05 | මැයි | 25.5 | 33.1 |
| 06 | ජුනි | 26.2 | 33.7 |
| 07 | ජූලි | 25.8 | 34.11 |
| 08 | අගෝස්තු | 23.9 | 33.7 |
| 09 | සැප්තැම්බර් | 23.3 | 33.7 |
| 10 | ඔක්තෝබර් | 22.2 | 31.4 |
| 11 | නොවැම්බර් | 22 | 29.5 |
| 12 | දෙසැම්බර් | 21.7 | 29.1 |
| එකතුව | | 283.56 | 376.79 |

## 3.8 දිස්ත්‍රික්කයේ මූලික සංඛ්‍යා ලේඛණ තොරතුරු.

| දිස්ත්‍රික්කයේ නම | කිළිනොච්චිය |
|---|---|
| පළාත | උතුරු පළාත |
| මුළු භූමි ප්‍රමාණය. | 1237.11 වර්ග කි.මි. |
| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සංඛ්‍යාව | 04 |
| ග්‍රාම නිලධාරි කොට්ඨාස සංඛව | 95 |
| ගම් සංඛ්‍යාව | 354 |
| ඡන්ද කොට්ඨාස සංඛ්‍යාව | 95 |
| ප්‍රාදේශීය සභා සංඛ්‍යාව | 03 |
| අමාත්‍යාංශයේ , දිස්ත්‍රික් ලේකම් යටතේ පවතින රජයේ නිල නිවාස | 16 |
| කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකවරුන්ගේ සංඛ්‍යාව | 01 |
| පාසල් සංඛ්‍යාව | 104 |
| පාසල් ළමුන් සංඛ්‍යාව | 31841 |
| ගුරුවරු සංඛ්‍යාව | 1444 |
| පාර්ලිමේන්තු නියෝජිත සංඛ්‍යාව | 09 |
| පළාත් පාලන නියෝජිත සංඛ්‍යාව | 04 |
| අභ්‍යන්තර අධිකාර සභා සාමාජිකයන් සංඛ්‍යාව | 37 |
| ජනතා එකතුව | 138513 |

4 .ආයතන ව්‍යුහය සහ අනුමත කාර්යමණ්ඩල තොරතුරු

4.1 ආයතන සංවිධාන සිතියම.



## 4.2 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අනුමත කාර්ය මණ්ඩල තොරතුරු

**දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කිළිනොච්චිය (ව්‍යාපෘති - 1 )**

| කිළිනොච්චි දිස්ත්‍රික්කය | | | | |
|---|---|---|---|---|
| **31.12.2015 හි අනුමත හා පුරප්පාඩු තිබෙන කාර්ය මණ්ඩල පිළිබඳ තොරතුරු දිස්ත්‍රික් ලේකම් කාර්යාලය** | | | | |
| වර්ගය | සේවා ශ්‍රේණිය /මට්ටම | අනුමත කාර්ය මණ්ඩල සංඛ්‍යාව | දැනට ඇති කාර්යමණ්ඩල | පුරප්පාඩු |
| ජ්‍යෙෂ්ඨ මට්ටම | | | | |
| දිසාපති | SLAS Special | 1 | 1 | 0 |
| අතිරේක දිසාපති | SLAS Class 1 | 1 | 1 | 0 |
| සහකාර දිස්ත්‍රික් ලේකම් | SLAS III | 2 | - | 2 |
| ප්‍රධාන ගණකාධිකාරී | SLAcs I | 1 | 1 | 0 |
| ප්‍රධාන අභ්‍යන්තර විගණකාධිකාරී | SLAcs I | 1 | 1 | 0 |
| ගණකාධිකාරී | SLAcs I/II/III | 1 | 1 | 0 |
| ඉංජිනේරු | SL.EngS II/II | 1 | 1 | 0 |
| **ශ්‍රේෂ්ඨ ගණයේ එකතුව** | | **8** | **6** | **2** |
| තුන්වන මට්ටම | | | | |
| පරිපාලන නිලධාරී | PMAS Supra | 1 | 1 | 0 |
| භාෂා පරිවර්තක | | 1 | 0 | 1 |
| **තුන්වන මට්ටමේ එකතුව** | | **2** | **1** | **1** |
| දෙවන මට්ටම | | | | |
| අයවැය සහකාර | Asso.officer | 1 | 1 | 0 |
| සංවර්ධන සම්බන්ධීකාරක | Asso.officer | 1 | 0 | 1 |
| සංවර්ධන නිළධාරී | III | 20 | 20 | 0 |
| පොදු කළමණාකරණ සහකාර | P.M.A I,II,III | 34 | 34 | 0 |
| සැළසුම් ශිල්පී | SLTS | 2 | 2 | 0 |
| කාර්මික නිළධාරී/ කාර්මික සහකාර | SLTS | 1 | 0 | 1 |
| **දෙවන මට්ටමේ එකතුව** | | 59 | 57 | 22 |
| මූලික මට්ටම | | | | |
| 0 | I,II,A,II B | 6 | 6 | 0 |
| ආරච්චි | OES I | 1 | 5 | 0 |
| දුරකථන ක්‍රියාකරු | | 1 | | |
| ලේඛකාධිකාරී | | 1 | | |
| පොත් තබන්නා | | 1 | | |
| ඡායා පිටපත් යන්ත්‍ර ක්‍රියාකරු | | 1 | | |
| කාර්යාල කාර්ය සහායක | OES II | 5 | 5 | 0 |
| වතු කම්කරු | | 1 | 1 | 0 |
| සනීපාරක්ෂක කම්කරු | | 2 | 2 | 0 |
| නිවාස මුරකරු | | 1 | 0 | 1 |
| මුරකරු | | 2 | 1 | 1 |
| **එකතුව** | | **22** | **20** | **02** |

## කාර්ය මණ්ඩල තොරතුරු : ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - කිළිනොච්චි දිස්ත්‍රික්කය

| 31.12.2015 හි අනුමත හා පුරප්පාඩු ව පවතින කාර්ය මණ්ඩල තොරතුරු ප්‍රාදේශීය ලේකම් කාර්යාලය 4 | | | | |
|---|---|---|---|---|
| තනතුර | සේවා ශ්‍රේණිය /මට්ටම | අනුමත කාර්ය මණ්ඩල සංඛ්‍යාව | වත්මන් ඇති කාර්යමණ්ඩල | පුරප්පාඩු |
| ජ්‍යෙෂ්ඨ මට්ටම | | | | |
| ප්‍රාදේශීය ලේකම් | SLAS I | 4 | 4 | 0 |
| ප්‍රාදේශීය ලේකම් | SLAS III | | | |
| සහකාර ප්‍රාදේශීය ලේකම් | SLAS III | 4 | 3 | 1 |
| ගණකාධිකාරි | SLAcs II/I, | 4 | 4 | 0 |
| ඉංජිනේරු | SL.Engs | 0 | 0 | 0 |
| **ජ්‍යෙෂ්ඨ මට්ටමේ එකතුව** | | **12** | **11** | **1** |
| තුන්වන මට්ටම | | | | |
| පරිපාලන නිලධාරි | Supra | 4 | 0 | 4 |
| ග්‍රාම සේවා නිලධාරී | | 95 | 82 | 13 |
| භාෂා පරිවර්තක | | 4 | 0 | 4 |
| **තුන්වන මට්ටමේ එකතුව** | | **103** | **82** | **21** |
| දෙවන මට්ටම | | | | |
| අයවැය සහකාර | Asso officer | 4 | 0 | 4 |
| සංවර්ධන සම්බන්ධීකාරක | Asso officer | 4 | 0 | 4 |
| සංවර්ධන නිළධාරි | | 26 | 26 | 0 |
| රාජ්‍ය කළමණාකරණ සහකාර | P.M.A I,II,III | 150 | 83 | 67 |
| කාර්මික නිළධාරි | SLTS | 4 | 4 | 0 |
| ඩ්රාෆ්ට්මන් | SLTS | 4 | 0 | 4 |
| **දෙවන මට්ටමේ එකතුව** | | **192** | **113** | **79** |
| ආරම්භ මට්ටම | | | | |
| රියදුරු | I,II,"A", II'B' | 12 | 9 | 3 |
| කාර්යාල කාර්ය සහායක | I | 12 | 10 | 2 |
| කාර්යාල කාර්ය සහායක | II/III | 33 | 15 | 18 |
| මුරකරු | II | 12 | 3 | 9 |
| **ආරම්භක මට්ටමේ එකතුව** | | **69** | **37** | **32** |

# 05. කාර්ය සාධනය

## 5.1 රාජ්‍ය පරිපාලන කටයුතු වල ප්‍රගතිය

### 5.1.1 පරිපාලන අංශයේ කටයුතු

#### 1. සංවර්ධන නිලධාරි පත්වීම්

උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාවට අයත් උපාධිධාරීන් අභ්‍යාසලාභීන් 27 දෙනෙකුට පත්වීම් ලැබුණේය. අපගේ දිස්ත්‍රික්කයේ පැවතුන අනෙක් පුරප්පාඩුවලට අනුව ඔවුන් අනුයුක්ත කරනු ලැබුවේ ය.

1. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය 06
2. කරච්චි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය 03
3. කණ්ඩාවලෙ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය 03
4. පූනකරි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය 01
5. පලෙ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය 00
6. ප්‍රාදේශීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන ආයතනය 02
7. සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව 03
8. ගොවි ජන සේවා සංවර්ධන දෙපාර්තමේන්තුව 06
9. වී පර්යේෂණ ආයතනය 01
10. ධීවර ජලජ සම්පත් දෙපාර්තමේන්තුව 01
11. ජාතික සමාජ ජලසම්පානද දෙපාර්තමේන්තුව 01

**නුවරඑළියට ස්ථාන මාරුවීම් 01**

#### 2. මාණ්ඩලික නිලධාරීන්ගේ තොරතුරු

ශ්‍රී ලංකා පරිපාලන සේවා විශේෂ - ස්ථාන මාරු ලබා පැමිණියේ ය.
ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය I ශ්‍රේණිය - ස්ථාන මාරු ලබා පැමිණියේ ය.
ශ්‍රී ලංකා පරිපාලන සේවා විශේෂ - විශ්‍රාම ලැබූහ.
ශ්‍රී ලංකා පරිපාලන සේවා විශේෂ - ස්ථාන මාරු ලැබ ගියේ ය.
ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය I ශ්‍රේණිය - ස්ථාන මාරු ලබා ගියේ ය.

#### 3. කළමනාකරණ සහකාර සේවය

12 දෙනෙකු නව පත්වීම් ලබා පැමිණියහ.

කණ්ඩාවලෙ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය 02

පූනකරි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය 07

පලෙ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය 01

කරච්චි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය 01

දිවිනැගුම දෙපාර්තමේන්තුව 01

### 5.1.2 අභ්‍යන්තර විගණන කටයුතු

අභ්‍යන්තර විගණන අංශය විසින් මෙම වසරේ සම්පූර්ණයෙන් විගණන ප්‍රශ්ණ 30 ක් යවා ඇත. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට පහක්, කරච්චි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට නවයක්, පච්චිලෛපල්ලි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට හතක්, කණ්ඩාවලෛ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට පහක්, පූනකරි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට හතරක් යවන ලද ප්‍රශ්නවලට පිළිතුරු ලැබුණ අතර නිසි හා නිවැරදි පියවර ගත් බව සඳහන් කළ යුතුය. තවද පසුගිය වසර සමඟ සැසඳීමේ දී මෙම වසර ඉතාමත් කාර්යක්ෂමතාවයෙන් යුතුව තිබුණේ ය.

වසරේ මැද භාගයේ දී ප්‍රධාන අභ්‍යන්ර විගණකාධිපති ස්ථානමාරු ගොස් මෙහි වැඩබැලීමේ නිළධාරී වශයෙන් වසරේ අවසාන භාගය තෙක් කටයුතු කළයේ. නව ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයෙක් අභ්‍යන්තර විගණක අංශයට පත් කරන ලදි. අභ්‍යන්තර විගණකයෙහි නැඟුණු ප්‍රශ්න හා ගැටළු විසඳීම සඳහා වසරේ විගණක සමාලෝචන රැස්වීම් සතරක් පවත්වන ලදි. පළමු වන රැස්වීම ගතවූ වසර සඳහා ද අනෙක් රැස්වීම් තුනම මෙම වසර සඳහා ද වේ. පළමුවන රැස්වීම සහ දෙවන රැස්වීමට උතුරු පළාත් සහකාර විගණකාධිපතිතුමා සහභාගි වූහ. විගණක සමාලෝචන රැස්වීම් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ද පවත්වන ලදි.

මෙම වසරේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ආදියට අමතර ව ප්‍රාදේශීය මධ්‍යස්ථාන ව්‍යාපෘති වැඩ සටහන්, පෙරපාසල්, දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලය, ප්‍රාදේශීය වැඩ සටහන් ආදිය ද විගණයට ලක් කරන ලදි.

5 එස් සංකල්පය ක්‍රියාත්මක කිරීමට අභ්‍යන්තර විගණක අංශය ඉතාමත් උද්යොගිමත්ව කටයුතු කරයි. මෙම විගණක සීමාව පුළුල් කර ඇති බව පෙන්වා දෙයි. අභ්‍යන්තර විගණක වාර්තා පිටපත් රාජ්‍ය විගණක දෙපාර්තමේන්තුවටත් රාජ්‍ය ස්වදේශ කටයුතු අමාත්‍යාංශයටත් යවා ඇත.

### 5.1.3 ආදායම් රැස් කිරීමේ කටයුතු.

| ආදායම් | ආදායම් විස්තර | තක්සේරුව | තිබෙන අයුරෙන් |
|---|---|---|---|
| 1003-07-02 | රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි ගාස්තු | 4,000,000.00 | 3,803,516.00 |
| 1003-07-03 | පෞද්ගලික ගස් ප්‍රවාහනය | 50,000.00 | 53,969.00 |
| 1003-07-99 | වෙනත් ආදායම් | 54,000.00 | 54,743.25 |
| 2002-01-01 | රාජයේ ගොඩනැගිලිවල කුලිය | 728,000.00 | 849,206,35 |
| 2002-02-99 | පොලිය | 2,000,000.00 | 1,883,871.34 |
| 2003-02-14 | මෝටර් රථ ප්‍රවාහන ගාස්තු | | 15,459,405.90 |
| 2003-02-03 | මහජන ආරක්ෂාව පිළිබඳ බලපත්‍ර ගාස්තු | | 5,750.00 |
| 2003-02-06 | සත්ත්ව හා වෘක්ෂලතා සංරක්ෂණ ආඥා පණත යටතේ ගාස්තු | | 800.00 |
| 2003-02-07 | විගමන පත් වීසා හා ද්විත්ව පුරවැසි ගාස්තු | | |
| 2003-02-13 | විභාග ගාස්තු | | 17,300.00 |
| 2003-04-00 | රජයේ සේවකයන්ගේ යතුරු පැදි සම්බන්ධ දීමනා | | 45,000.00 |
| 2003-02-99 | වෙනත් සිල්ලර බඩු | 760,000.00 | 10,956,320.14 |
| 2003-99-00 | වෙනත් කුළී | 3,500,000.00 | 2,216,782.57 |
| 2004-01-00 | වැන්දඹු අනත්දරු දායකත්වය | 6,000,000.00 | 6,370,179.23 |

## 5.1.4 මිනිස්බල හා රැකිරක්ෂා දෙපාර්තමේන්තුවේ කටයුතු

| අංක | සංවර්ධන වැඩසටහන | වැඩසටහන පැවැත්වූ ස්ථාන | ප්‍රතිලාභීන් |
|---|---|---|---|
| 01 | රැකිය මඟ පෙන්වීම් සබැඳිව ගුරුවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන් | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 40 |
| 02 | රැකියා මඟ පෙන්වීම් සිසුන්හට | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 1042 |
| 03 | රැකියා මඟ පෙන්වීම් රැකියා සොයන්නන්හට | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 904 |
| 04 | රැකියා මඟ පෙන්වීම් ආබාධිතඅයහට | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 500 |
| 05 | ස්වයංරැකියා දිරිමත් කිරීමේ වැඩසටහන් | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 70 |
| 06 | රැකියා පොළ | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 350 |
| 07 | රැකියා මඟ පෙන්වීම් දෙමාපියන්යට | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 400 |
| 08 | රැකියා කම්ටු වැඩසටහන් | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 40 |
| 09 | රැකියා අවස්ථාවන් සඳහා දිරිගන්වන වැඩසටහන් | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 35 |
| 10 | උත්සාහවන්තභාවය සංවර්ධනය කිරීමේ පාඨමාලාව | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 30 |
| 11 | අවශ්‍යතාවය මත වූ පාඨමාලාව | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 95 |
| 12 | පීඩාවට පත්වූවන් රැකියා අවස්ථාවන්වලට යොමු කිරීමේ වැඩ සටහන | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 35 |
| 13 | රැකියාවන්හි අභියෝගයන් ජය ගැනීමේ වැඩසටහන | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 60 |
| 14 | පුහුණුවට යැවූ අයවලුන් | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 304 |
| 15 | ඍජුවම රැකියා ලබාගත් අයවලුන් | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 181 |
| 16 | එකතුව | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 4086 |

## රැකියා මාර්ගෝපදේශ සම්මන්ත්‍රණය








### 5.1.5. මැතිවරණ දෙපාර්තමේන්තුවේ කටයුතු

### ඡන්ද දායකයින් සංඛ්‍යාව - 2015

10 යාපනය මැතිවරණ දිස්ත්‍රිකයේ 'ක' කිලිනොච්චි මැතිවරණ කොට්ඨාශය (කිලිනොච්චි පරිපාලන දිස්ත්‍රික්කයේ) ලියාපදිංචි ඡන්ද දායකයින් සංඛ්‍යාව -81702

### ප්‍රාදේශීය සභා - 03

1. කරච්චි ප්‍රාදේශීය සභාව
2. පූනකරි ප්‍රාදේශීය සභාව
3. පච්චිලෛපල්ලි ප්‍රාදේශීය සභාව

**උතුරු පළාත් සභා නියෝජිතයන් සංඛ්‍යාව**

- යාපනය ......................16
- කිලිනොච්චි.................04
- මන්නාරම..................05
- වවුනියාව....................06
- මුලතිව්........................05

එකතුව.......................36

### 2015 වර්ෂයේ මැතිවරණ දෙපාර්තමේන්තුවේ කටයුතු
### ජනාධිපති මැතිවරණය - 2015

2015 ජනාධිපති මැතිවරණ කටයුතු වල 2014 වර්ෂයේ නොවැම්බර් මසයේ දී ආරම්භ කළේය. මෙම මැතිවරණය සඳහා මනාප ජනවාරි 8 වන දිනයේ දී කිලිනොච්චි දිස්ත්‍රික්කයේ ඡන්ද මධ්‍යස්ථාන 96ක දී පවත්වන ලදි. මේ වන විට තැපැල් ඡන්ද හැර සාධාරණ ඡන්ද ගණන්කිරීමේ කටයුතු මධ්‍යස්ථාන 07 ක දී සිදුකරන ලද ඡන්ද ප්‍රතිඵල ප්‍රකාශයට පත් කළේය ය.

## ඡන්දදායක දිනය -2015

ඡන්දදායක දිනය වන ජුනි මස 01 වන දින, උතුරු පාළාතේ ඡන්දදායක දින උත්සව වවුනියා දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ දී පවත්වන ලදි.
ජුනි මස 08 වන දින ධර්මපුරම්හි කිලිනොච්චි දිස්ත්‍රික්කයේ මැතිවරණ කාර්යාලය විසින් ඡන්ද දායක දින උත්සව පවත්වන ලදි. මෙහි පොදු ජනතාව අතර ඡන්ද අයිතිවාසිකමෙහි අවශ්‍යතාවය හුවා දක්වන අයුරින් දැනුවත් කිරීමේ පා ගමනක් හා වීදි නාට්‍යක්ද පවත්වනු ලැබුවේ ය. තවද සිසුන් සඳහා වූ විනාඩියක පැන වැඩසටහනක් ද තවත් කලා සංදර්ශනද සංවිධාන කරනු ලැබුවේය.

## ඡන්ද නාම ලැයිස්තු සමාලෝචනය -2015

2015 වන වර්ෂය සඳහා වූ ඡන්ද නාම ලැයිස්තුව සමාලෝචන හා සබැඳි කටයුතු 2015 ජුනි මස 01 වන දින සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ හරහා ග්‍රාම සේවා වසම්වල ආරම්භ කරන ලදි.2015 දෙසැම්බර් මස 31 වන දින සමාලෝචන කටයුතු සියල්ලක්ම නිම කොට සමාලෝචනයට ලක් කරන ලද 2015 වර්ෂයට අදාළ ඡන්ද නාම ලේඛණ ලැයිස්තුව කිලිනොච්චි මැතිවරණ කොමසාරිස් ආර්.සී. අමල්රාජ් මහතා විසින් සහතික කරන ලදි.

## පාර්ලිමේන්තු මැතිවරණය - 2015

2015 පාර්ලිමේන්තු මැතිවරණය හා සබැඳි කටයුතු 2015 ජුනි මස ආරම්භ කරන ලදි. මෙම මැතිවරණයේ ඡන්ද ප්‍රකාශය කිරීම අගෝස්තු මස 17වන දින කිලිනොච්චි දිස්ත්‍රික්කයේ ඡන්ද මධ්‍යස්ථාන 96 ක ද තැපැල් ඡන්ද හැර සාමාන්‍ය ඡන්ද ගණන් කිරීමේ කටයුතු ඡන්ද ගණන් කිරීමේ මධස්ථාන 07 ක ද සිදු කර ප්‍රතිඵල නිකුත් කරනු ලැබුවේ ය.

## ඡන්ද ලැයිස්තුවල පිටපත්

පොදු ජනතාවගේ නොයෙක් අවශ්‍යතාවන්වලට ඡන්ද ලැයිස්තු පිටපත් ලබා දෙනු ලබන්නේය. ඒ අනුව විශ්ව විද්‍යාල ප්‍රවේශය, සම්මුඛපරීක්ෂණ, අධිකරණ අවශ්‍යතාවයන් හා ඉඩම් වෙන් කිරීමේ කටයුතු වැනි නොයෙක් අවශ්‍යතාවයන්වලට කිලිනොච්චි දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය වසින් 2015 වර්ෂයේ පිටපත් 931ක් ලබා දී තිබේ.

## 5.1.6. දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ කටයුතු.

### ලේඛණය ලියාපදිංචි කිරීම

i. ලියාපදිංචි කිරීමේ ඔප්පුව ........................................................1828

ii. ලියාපදිංචි කළ රාජ්‍ය අනුමති පත්‍ර..................................................413

iii. ලැබුණු ඔප්පු පිටපත් ................................................................950

iv. ලබා දුන් ඔප්පු පිටපත් ...............................................................73

v. ලබා දුන් කෙටි පිටපත්.............................................................322

vi. නිකුත් කරන ලද අනුමාන වයස් සහතික ....................................56

vii. ලැබුණු සෙවීමේ අයදුම් පත් .......................................................03

viii. අනුමත කරන ලද සංශෝධිත සහතික ......................................182

ix. පරිවර්තන අයදුම්පත් සංඛ්‍යාව ................................................360

ගාස්තු (ඉඩම් රෙජිස්ට්‍රාර්)

i. ඔප්පු ලියාපදිංචි කිරීම්..............................................රු.173,700.00

ii. ඔප්පු පිටපත්, කෙටි පිටපත්.......................................රු.576,000.00

iii. සෙවීම්.........................................................................රු.1,500.00

iv. පිටපත් සඳහා අලවන ලද මුද්දර ගාස්තු ...................රු.6,774,205.00

v. පරිවර්තන ගාස්තු.....................................................රු.180,000.00

vi. ලැබුණු අයදුම්පත්....................................................රු.278,000.00

**ප්‍රාදේශීය ලේකම් කාර්යාල කටයුතු විස්තර**

i. ලැබුණු උපත්, මරණ, විවාහ අයදුම්පත්...................................22880

ii. ලබා දුන් පිටපත්...................................................................31522

iii. ලියාපදිංචි උපත්.......................................................................2030

මරණ..........................................................................................360

විවාහ..........................................................................................945

iv. අනුමත කළ සංශෝධන.............................................................696

v. අනුමත කරන ලද කල් ගත වූ උපත්(24).....................................357

vi. අනුමත කරන ලද කල් ගත වූ මරණ(36)........................................13

**ගාස්තු විස්තර (ප්‍රාදේශීය ලේකම්)**

**(කරච්චි,කණ්ඩාවලෙ,පච්චිලෛපල්ලි,පූනකරි)**

i. ලැබු කල් ගත වූ උපත් ණු (උපත්,විවාහ,මරණ) අයදුම්පත්වල ගාස්තු

ඒ+බී..........................................................................රු.3,645,300.00

ii. ලැබුණු කල් ගත වූ උපත්, කල් ගත වූ මරණ සහ සංශෝධිතයන් සම්බන්ධ ගාස්තු

..........................................................................................රු.47,550.00

iii. විවාහ ලියාපදිංචි ගාස්තුව..........................................................රු.87,900.00

## 5.1.7 ආපදා කළමනාකරණ කටයුතු

ආපදා කළමනාකරණය සඳහා වූ ශ්‍රී ලංකාවේ පවතින රාජ්‍ය ක්‍රමයේ ප්‍රධාන අංගයක් ලෙස ආපදා කළමනාකරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය වැජඹේ, මෙය ශ්‍රී ලංකාවේ සියලුම අයවලුන් දරා සිටින එකඟ වූ ප්‍රතිපත්ති හා ආපදා කළමනාකරණයෙන් බලාපොරොත්තු වන ප්‍රගතිය ආදිය සඳහන් කරයි. ආපදා කළමනාකරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය මත කිලිනොච්චි දිස්ත්‍රික්කයේ ආපදා කළමනාකරණ අංශ හරහා පසුගිය 2015 වර්ෂයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 4 හි ම පෙර සූදානම් කටයුතු, පුහුණුව හා දැනුවත් කිරීමේ කටයුතු හා ආපදා අවම කිරීමේ කටයුතු කරනු ලැබුවේ ය.

ඒ සමඟ රාජ්‍ය නොවන ආයතන සමඟ එක්ව ආපදා අවම කිරීමේ වැඩසටහන් (වර්ල්ඩ් විෂන් ආයතනය හා ටිබෝක්කෝ ( viii වැඩ සටහන ) ආදිය විසින් ක්‍රියාත්මක කරනු ලැබුවේ ය.

පසුගිය මෝසම් වැසි හේතුවෙන් ඇති වූ ගංවතුර ආපදා හේතුවෙන් අපගේ දිස්ත්‍රික්කයේ පවුල් 6,796කට අයත් සාමාජිකයින් 23,200ක් පීඩාවට පත්වුණේය.මෙම අයවලුන් සහන කඳවුරු 24 ක නතර කරනු ලැබූ හ. මොවුන් සඳහා පිසින ලද ආහාර, වියළි ආහාර හා ආහාර නොවන භාණ්ඩ ද ආපදා සහන සේවා මධ්‍යස්ථානය හරහා ලබා දෙනු ලැබුවේ ය. තවද, හදිසි ක්‍රියාන්විත මුදල හරහා ගංවතුර ආපදාව වහාම අවම කිරීම උදෙසා ජලාපවහන ඇළවල් පුනරුත්ථාපනය කිරීම හා ආහාර නොවන භාණ්ඩ ද බෙදා දෙනු ලැබුවේ ය. මෙම කටයුතු සඳහා රාජ්‍ය නොවන ආයතනවල ආධාර ද ලබා ගන්නා ලදි. තවද නියඟය හේතුවෙන් පවුල් 3,636ට අයත් සාමාජිකයින් 13,060 පීඩාවට ලක්වූ හ. මොවුන් සඳහා ආපදා සහන සේවා මධ්‍යස්ථානය හරහා පානීය ජලය සපයන ලදි.

| වැඩසටහන | වැඩසටහන් විස්තර | වැඩසටහන් සංඛ්‍යාව | ප්‍රතිපාදන | වැය | ඉතුරු |
|---|---|---|---|---|---|
| පෙර සූදානම් වැඩසටහන් | • ආපදා පෙර සූදානම් (සුනාමි, ගංවතුර)<br>• පාසල්වල ආපදා ආරක්ෂාව<br>• වැව් ආරක්ෂාව<br>• රෝහල් ආපදා ආරක්ෂාව<br>• කාලෝචිත සාකච්ඡාව- ප්‍රාදේශීය ලේකම්<br>• ප්‍රදේශ මට්ටමේ ආපදා කළමණාකරණ සැළසුම්කරණය.<br>• ග්‍රාමීය මට්ටමේ ආපදා කළමනාකරණ සැළසුම්. | 40 | 441,000.00 | 425,521.00 | 15,479.00 |
| දැනුවත් වැඩසටහන් | • පාසල් ගුරුවරුන් පුහුණුකිරීම<br>• පාසල් ළමුන් පුහුණු කිරීම<br>• ධීවරයන් පුහුණුකිරීම<br>• රජයේ සේවකයන් පුහුණු කිරීම<br>• මාධ්‍යවේදීන් පුහුණු කිරීම<br>• කඳවුරු කළමනාකරණ හා ප්‍රථමාධාර පුහුණු<br>• ග්‍රාමීය ආපදා කළමනාකරණ කමිටුව | 17 | 284,000.00 | 263,518.00 | 20,481.80 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | අලුත් කිරීම.<br>• දිස්ත්‍රික් ආපදා කළමනාකරණ කමිටු සාකච්ඡාව | | | | |
| ආපදා අඩු කිරීමේ වැඩසටහන | • පොදුලිං සකස් කිරීම (පූනකරි,කණ්ඩාවලෙල, පච්චිලෙපල්ලි) | 17 | 4,766,374.41 | | |
| | • වැලි ගොඩ ඉවත් කිරීම( පච්චිලෙප්පල්ලි,පූනකරි,කණ්ඩාවලෙල,කරච්චි) | 43 | 23,798,989.41 | 21,214,438.26 | 2,584,551.15 |
| හදිසි අවස්ථා වැඩසටහන | • ගංවතුර ආපදා හදිසි අවස්ථා මුදල් (අපද්‍රව්‍ය බැහැර කිරීම). | | 1,005,200.00 | 1,003,400.00 | 1800.00 |
| රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන වල ඒකාබද්ධ වැඩසටහන | • DIPECHO VIII), කෝවිල්වයල්, ධරමංකේනි, තම්බහාමම්, කල්මඩු,ඉත්තාවිල්,පුලියම්පොක්කනෙ, පෙරියකුලම්)<br>• වර්ල්ඩ් විෂන් (උරුත්තිරපුරම්,මාවඩියම්මන් උතුරු) | ග්‍රාම සේවා වසමේ ආපදා අඩුකිරීම් සැළසුම් කටයුතු ක්‍රියාත්මක කිරීම. | | | |

### පෙර සූදානම් වැඩමුළු

- ප්‍රාදේශීය, පළාත් මට්ටමේ ආපදා පෙර සූදානම් සාකච්ඡාව.



ප්‍රාදේශීය මට්ටමේ සාකච්ඡාව



දිස්ත්‍රික් මට්ටමේ සාකච්ඡාව

- පාසල් මට්ටමේ ආපදා කළමනාකරණ කටයුතු සම්බන්ධව දැනුවත් කිරීම හා වැඩමුළු



ඉයක්කච්චි ර.දෙ.මි. පාසල



දිස්ත්‍රික් මට්ටමේ සාකච්ඡාව



කිළාලි ධීවරයන්



නල්ලූර් ධීවරයන්



ජාත්‍යාන්තර ආපදා අඩු කිරීමේ දිනය



දිස්ත්‍රික් ලේකම් කාර්යාල නිලධාරීන් සඳහා ගිණිනිවීමේ පුහුණු වැඩසටහන

**ආපදා සහන සේවා මධ්‍යස්ථානයේ ක්‍රියාකාරකම්.**

**1. ආපදා වලට එරෙහිව ශක්තිමත් නිවාස සැළසුම්**

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | නිවාස ගණන | වියදම් එකතුව රු. |
|---|---|---|
| කරච්චි | 4 | 2,000,000.00 |
| කණ්ඩාවලෙ | 2 | 1,000,000.00 |
| පූනකරි | 2 | 1,000,000.00 |
| පච්චිලෛපල්ලි | 1 | 500,000.00 |
| **එකතුව** | **9** | **4,500,000.00** |



පූනකරි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය



කණ්ඩාවලෙ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය

**2 නියංකාලය තුළ පානීය ජලය බෙදාහැරීම.**

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | නියඟයෙන් පීඩාවට පත්වූවන් | | පානීය ජලය බෙදා දීම | | වියදම් එකතුව රු. |
|---|---|---|---|---|---|
| | පවුල් | සාමාජිකයන් | පවුල් | සාමාජිකයන් | |
| කරච්චි | 433 | 1,460 | | | 0.00 |
| කණ්ඩාවලෛ | 372 | 1,265 | 240 | 819 | 39,993.50 |
| පූනකරි | 1,964 | 7,525 | 1,376 | 4,163 | 85,923.50 |
| පච්චිලෛපල්ලි | 867 | 2,810 | 210 | 1,218 | 176,461.35 |
| එකතුව | **3,636** | **13,060** | **1,826** | **6,200** | **302,378.35** |

## 3. ගං වතුර ආධාර

- පිසූ ආහාර ලබා දීම

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | පිසූ ආහාර ලබා දුන් | | වියදම් වූ ගණන රු. |
|---|---|---|---|
| | පවුල් | සාමාජිකයන් | |
| කරච්චි | 242 | 792 | 170,667.50 |
| කණ්ඩාවලෙ | 1,000 | 3,314 | 759,487.25 |
| පූනකරි | 18 | 63 | 306,745.00 |
| පච්චිලෛපල්ලි | 234 | 856 | 25,850.00 |
| **එකතුව** | **1,494** | **5,025** | **1,262,749.75** |

- වියළි ආහාර බෙදා හැරීම

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | වියළි ආහාර ලබාදුන් | | වියදම් වූ ගණන රු. |
|---|---|---|---|
| | පවුල් | සාමාජිකයන් | |
| කරච්චි | 2,055 | 6,410 | 2,255,300.00 |
| කණ්ඩාවලෛ | 1,755 | 6,255 | 2,029,040.75 |
| පූනකරි | 912 | 2,416 | 916,200.21 |
| පච්චිලෛපල්ලි | 1,038 | 3,277 | 1,140,600.00 |
| **එකතුව** | **5,760** | **18,358** | **6,341,140.96** |

## 5.1.8. මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ කටයුතු

කිලිනොච්චිය මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් අංශයේත් පොදු ජනතාවත් තමන්ට අවශ්‍ය රියැදුරු බලපත් ලබා ගැනීම, තමන් ගේ රථවාහන අංකතහඩු ලබා ගැනීමත්, තමන්ගේ රථවාහන පරික්ෂා කර වාර්තා ලබා ගැනීම , ආදි සේවාවන් ප්‍රමාණවත් ලෙස ලබා ගනිති.

මෙලෙස පසුගිය 2015 වන වර්ෂයේ ප්‍රමාණවත් සේවාවන් පොදු ජනතාවත් ලබා ගත්තේය. එලෙස පොදු ජනතාවට කළ සේවාවන් වනාහි,

අලුතින් රියදුරු බලපත්‍ර ලබා ගැනීම සඳහා අයදුම්පත් 4519 ක් ද මේ වන විට රියදුරු බලපත්‍ර ලබා ගෙන සිටින අයවලුන් විසින් සැහැල්ලු වාහන දිගුව සඳහා අයදුම්පත් 338 ක්ද බර වාහන දිගුව සඳහා අයදුම්පත් 301 ක්ද ලෙස සම්පූර්ණයෙන් 5150ක් රියදුරු අයදුම්පත් ලබා ගනු ලැබුවේය.

මෙලෙස ඉල්ලුම් කරන ලද අලුත් අයදුම්කරුවන් 4519 , බර වාහන අයදුම්කරුවන් 301 දෙනෙකු ද නැවත පරීක්ෂණයන්ට අයදුම් කළ 3482 දෙනෙක් ද එකතුව සම්පූර්ණයෙන් 8302 දෙනෙකුට ලිඛිත පරීක්ෂණ පවත්වන ලදී. එයින් සමත් වූ 4219 දෙනෙකුට තාවකාලික පුහුණු බලපත්‍ර ලබා දෙන ලදී.

මෙලෙස ලිඛිත පරීක්ෂණය ලියා පුහුණු බලපත්‍ර ලබා ගත් අයවලුන් හා මේ වන විට පුහුණු බලපත්‍ර ලබා ගෙන සිටින අයවලුන් යන 4531 දෙනෙකුට ප්‍රායෝගික පුහුණු පවත්වා 4531 තාවකාලික බලපත්‍ර ලබා දෙන ලදී.

තව ද මූලස්ථානයෙන් නිකුත් කරන ලද 551ක වාහන අංක තහඩුවලට අදාළ අයදුම්කරුවන්ට නිකුත් කරන ලදී.

තව ද වාහන වල බොඩියේ වෙනස්කම් කිරීමට අයදුම් කළ අයදුම්කරුවන් 57 දෙනෙකුගේ වාහන පරික්ෂා කර වාහන බර සහතික නිකුත් කරන ලද අතර නොයෙක් අවශ්‍යතාවයන් මත වාහන පරික්ෂා කර 143ක වාර්තා නිකුත් කරන ලදී.

### 5.1.9 විශ්‍රාම වැටුප් කටයුතු

| අංකය | ප්‍රාදේශීය ලේකම් කාර්යාල | විශ්‍රාම වැටුප් | | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් | | සම්පූර්ණ විශ්‍රාමික යින් සංඛ්‍යාව | සම්පූර්ණ විශ්‍රාම වැටුප් වටිනාකම |
|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | වටිනාකම | සංඛ්‍යාව | වටිනාකම | | |
| 01 | පච්චිලෙපල්ලි | 40 | 861,213.48 | 31 | 607,566.48 | 71 | 1,468,779.96 |
| 02 | කරච්චි | 434 | 9,675,170.78 | 200 | 5,263,611.45 | 634 | 14,938,782.23 |
| 03 | පූනකරි | 54 | 1,131,918.83 | 23 | 439,666.24 | 77 | 1,571,585.07 |
| 04 | කණ්ඩාවලයි | 74 | 1,583,381.23 | 41 | 749,340.57 | 115 | 2,332,721.80 |
| එකතුව | | **602** | **13,251,684.32** | **295** | **7,060,184.74** | **897** | **20,311,869.06** |

## 5.1.10 සංගණන හා සංඛ්‍යා ලේඛණ දෙපාර්තමේන්තුවේ කටයුතු

මෙම දිවයිනේ සමාජ ආර්ථික තත්ත්වය සම්බන්ධව සංඛ්‍යා ලේඛණ තොරතුරු එක් රැස් කිරීම, වර්ග කිරීම, නිරීක්ෂණයට ලක් කිරීම, සංඛ්‍යා ලේඛණ සංඥා ගණනය කිරීම ආදි සේවාවන් මධ්‍යම රජයේ නියෝජිත මධ්‍යස්ථානයක් වන සංඛ්‍යා ලේඛණ දෙපාර්තමේන්තුව සතුය. රජයේ ජාතික සැලසුම් සකස් කිරීම, ප්‍රතිපත්ති සැදිම, ආදිය ද මෙහි ප්‍රගතිය තක්සේරු කිරිම ආදියට ද අවශ්‍ය තොරතුරු ලබා දෙයි. එක් රැස් කරන ලද මෙම තොරතුරු ජනගහනය , කෘෂිකර්මය, වෙළද , කර්මාන්ත , මිල හා ජාතික ආදායම වැනි නොයෙක් කරුණු ඇතුළත් වේ. දිස්ත්‍රික් සංඛ්‍යා ලේඛණ අංශය විසින් 2015 වන වර්ෂයේ කරන ලද සංඛ්‍යා ලේඛණ කටයුතු පහත දැක්වේ.

- **ශ්‍රී ලංකා රැකියා අවස්ථා ගණනය**

ශ්‍රී ලංකා රැකියා අවස්ථා ගණනය වනාහි කාර්තුවක් පාසාම දිගටම කරගෙන යන මිණුමක් වේ. මෙම දිවයිනේ වර්තමාන රැකියා අවස්ථාවන් වල තත්වය තක්සෙරු කිරීමටත් කාර්තුවෙන් කාර්තුවට ඇති වන වෙනස් වීම් දැන ගැනීමටත් පවත්වනු ලබනවා.

- **වී අස්වනු තක්සේරු ගණනය**

දළ වශයෙන් වී අස්වැන්න තක්සේරු කිරීම සදහා දිස්ත්‍රික් මට්ටමේද ජාතික වශයෙන් ද වී අස්වැන්න ගණනය කිරීම සදහා වසරකට දෙවරක් වී අස්වනු ගණනය කරනු ලැබේ.

- **කර්මාන්ත වාර්ෂික ගණනය**

මෙම ගණනය පතල් කැනීම් , ගල් කැඩීම, නිෂ්පාදන කර්මාන්ත, විදුලිය, වාතය, ජලය, ජල සම්පාදනය සම්බන්ධ ආර්ථික උත්සාහයන් අඩංගු වේ.

- **ඉදි කිරීම් කර්මාන්ත ගණනය**

ඉදි කිරීම් කර්මාන්තය සම්බන්ධ මූලික තොරතුරු එක් රැස් කිරීම සදහා දිගු කාර්යයක් ලෙස මෙම ගණනය වාර්ෂිකව පවත්වනු ලබනවා.

- **වී සංඛ්‍යා ලේඛනය**

දිගු කාර්යයක් ලෙස දිස්ත්‍රික්කයේ පිහිටි සියළුම කුඹුරු ඉඩම් හඳුනා ගැනීම හා වපුරන ලද , අස්වනු නෙළා ගන්නා ලද වී වගාවේ වපසරිය එක් රැස් කිරීම වාර්ෂිකව පවත්වනු ලබනවා.

- **ගොඩබිම් වගාව**

මෝසම් භෝගයන් , ස්ථිර හා අර්ධ ස්ථිර භෝග හා ඒවා වගා කර ඇති වපසරිය , නිෂ්පාදන ප්‍රමාණය ආදිය එක් රැස් කරනු ලබයි.

- **සත්ත්ව පාලන සංඛ්‍යා ලේඛණය**

දිස්ත්‍රික් මට්ටමේ සත්ත්වයන් ගේ සංඛ්‍යාව හා ඒවායේ නිෂ්පාදන පිළිබඳ සංඛ්‍යා ලේඛන ද එක් රැස් කරනු ලබයි. තව ද අනුමැතිය ලබා ඇති කැපුම් මධ්‍යස්ථාන වල මසට මරා දමන ලද සත්ත්වයන් ගේ සංඛ්‍යාව ද එක් රැස් කරනු ලබයි.

- **සිල්ලර නිෂ්පාදන මිල සංඛ්‍යා ලේඛණය**

ආහාර ද්‍රව්‍ය හා විවිධ භාණ්ඩවල මිල හා දිස්ත්‍රික්කයේ සතිපතා , මාසික හා වාර්ෂික ලෙස එක් රැස් කරනු ලබයි. තව ද දේශීය ව නිෂ්පාදනය කරනු ලැබූ භාණ්ඩ වල මිල ද මාසිකව එක් රැස් කරනු ලබයි

- **පළාත් පාලන සංඛ්‍යා ලේඛණය**

දිස්ත්‍රික්කයේ ඇති ප්‍රාදේශීය සභාවල ආදායම, වියදම හා ඔවුන් විසින් සපයන ලද සේවාවන් සම්බන්ධ විස්තර එක් රැස් කරනු ලබයි.

## 5.1.11 මධ්‍යම පරිසර අධිකාර සභාව කටයුතු

### ජනාධිපති කාර්ය සාධක බලකායේ විශේෂ වැඩසටහන යටතේ පාරිසරික ආරක්ෂණ ජාතික වැඩසටහන

කරච්චි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හා මධ්‍යම පාරිසරික අධිකාරිය ද එක්ව ජනාධිපති කාර්ය සාධක බලකායේ විශේෂ වැඩ සටහන අනුව පාරිසරික ආරක්ෂණ ජාතික වැඩ සටහන යටතේ මරුදනගර් පන්නංකණ්ඩි තිරුවෛයාරු, සිවනගර්, උරුත්තිරපුරම් බටහිර ග්‍රාම සේවා වසම්වල පාරිසරික ආරක්ෂණ දැනුවත් කිරීමේ වැඩමුළු පවත්වනු ලැබුවේය.

මෙම දැනුවත් කිරීමේ වැඩ මුළුවේ මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ වැදගත්කම සම්බන්ධව හා තම වසමේ මෙතෙක් පාරිසරික ආරක්ෂණය සඳහා පවත්වන ලද ක්‍රියාවන් සම්බන්ධව ද දන්වා සිටි අතර ප්‍රාදේශීය වශයෙන් පාරිසරික ආරක්ෂණයේ වැදගත්කම සබැඳිව දැනුවත් කරමින් යුතු අදහස් ප්‍රකාශ කිරීම සිදු කරන ලදි.

පන්නංකණ්ඩි ග්‍රාම නිලධාරී වසම




මරුදනගර් ග්‍රාම නිලධාරී වසම




තිරුවෛයාරු ග්‍රාම නිලධාරී වසම




උරුත්තිරපුරම් ග්‍රාම නිලධාරී වසම





## 5.1.12 ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ කටයුතු.

ජාතික සහජීවනය, සාකච්ඡා ( සමාජ ඒකාබද්ධතාවය) හා සබැඳි කටයුතු

- 5 වන වසරේ ශිෂ්‍යත්ව විභාගයට ඉදිරිපත්වන සිසුන් සඳහා දීර්ඝ වැඩමුළු

ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අංශයේ සමාජ ඒකාබද්ධතා සතිය - 2015 වෙනුවෙන් මෙම වසරේ 5වන වසරේ ශිෂ්‍යත්ව විභාගයට පෙනී සිටි සිසුන් සඳහා වන පෙර පන්තීන් ඉතාමත් දුෂ්කර ප්‍රදේශවලට අයතු ජෙයපුරම්, ස්කන්ධපුරම්, රාමනාදපුරම්, යන ගම්මාන තුනටම අයත් සිසුන්හට පවත්වන ලදි. පළමුවන වැඩමුළුවේ 2015.07.28 වන දින ජෙයපුරම් මහා විද්‍යාලයේ දී පූනකරි අධ්‍යාපන කලාපයට අයත් පාසැල් 10 ක සිසුන්හට පවත්වන ලදි. එහි සිසුන් 330 දෙනෙක් ප්‍රතිලාභ ලබා ගත්හ. දෙවන පන්ති 2015.07.28 දින ස්කන්දපුරම් අංක 01. ර.මී.පා. පාසලේ කරච්චි අධ්‍යාපන කළාපයට අයත් පාසල් 10 කට අයත් සිසුන්හට පවත්වන ලදි. මෙම වැඩමුළුවේ සිසුන් 244 දෙනෙක් සහභාගී වූහ. තෙවන වැඩමුළුවේ 2015.08.02 වන දින රාමනාදපුරම් මහා විද්‍යාලයේ දී කරච්චි අධ්‍යාපන කළාපයට අයත් පාසල් 11 ක සිසුන් සඳහා පවත්වන ලදි.මෙම වැඩමුළු කිලිනොච්චි කලාපයේ ප්‍රාථමික අංශය, සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂක සිසුන් පාසල්වල ගුරුවරුන්, කලාප අධ්‍යාපන උපදේශකවරුන්, සම්පත්දායකයින්,ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අංශයේ නිළධාරීන්, දෙමව්පියන් යන අයවලුන් සහභාගී වූහ.

- **මත්ද්‍රව්‍ය භාවිතයෙන් ඇතිවන ශාරීරික, මානසික හා සමාජ බලපෑම් සබැඳි තරුණ තරුණියන් සඳහා වූ වැඩමුළුව ( 19.11.2015- 21.11.2015)**

ජාතික සංවාද අමාත්‍යාංශයේ උතුරු පළාත් මධ්‍යස්ථානය විසින් කිලිනොච්චි දිස්ත්‍රික්කයට අයත් පුහුණු කාන්තා නායිකාවන්ගේ සහභාගීත්වයෙන් යාපනය හා කිළිනොච්චි දිස්ත්‍රික්කයට අයත් තරුණ

තරුණියන් 60 දෙනෙකුට මත් ද්‍රව්‍ය භාවිතයෙන් ඇතිවන ශාරීරික, මානසික හා සමාජීය බලපෑම් සබැඳි දැනුවත් කිරීමේ වැඩමුළුව කිලිනොච්චි මිතුරු නිවාස ශාලාවේ 19.11.2015 සිට 21.11.2015 වන දින දක්වා වූ කාලවකවණුවේ දී පවත්වන ලදි. මෙම තෙදින වැඩ මුළුවේ ආරම්භක උත්සවයේ දී ජාතික සංවාද අමාත්‍යාංශයේ ගරු අමාත්‍යවරයා, අමාත්‍යාංශයේ ලේකම්, අතිරේක ලේකම්, ජාතික භාෂා අධ්‍යාපන පුහුණු ආයතනයේ අධ්‍යක්ෂකවරයා, කිලිනොච්චි දිස්ත්‍රික් ලේකම්, උතුරු පළාත් මධ්‍යස්ථානයේ නිළධාරීන් යාපනය හා කිළිනොච්චි දිස්ත්‍රික්කයට අයත් තරුණ තරුණියන් හා කාන්තා නායිකාවන් සහභාගී වූහ.

- **මහජන සහභාගිත්වයෙන් යුතු වැඩසටහන්.**

සමාජ ඒකාබද්ධතා සතිය -2015 උදෙසා සමාජ මට්ටමේ මහජන සහභාගීත්වයෙන් යුතු වැඩ සටහන යටතේ කරච්චි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අම්බාල් නගර් ග්‍රාම සේවා නිලධාරී වසමේ කනහාම්බිගෙ පෙර පාසලට වැසිකිලියක් ඉදි කරන ලදි.

සමාජ ඒකාබද්ධතා සතිය -2015 උදෙසා සමාජ මට්ටමේ මහජන සහභාගිත්වයේන යුතු වැඩ සටහන යටතේ පූනකරි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මුලංකාවිල් ග්‍රාම සේවා නිළධාරී වසමේ නළ ළිඳක් තනන ලදි.

- **කාන්තා නායිකාවන් සවිබල ගැන්වීමේ වැඩසටහන්**

කාන්තා නායිකාවන් සවිබල ගැන්වීමේ වැඩ සටහන් - සමාජ ඒකාබද්ධතාවය ඇති කිරීමට නෛතික හා ආයතනික වශයෙන් ජාලය ශක්තිමත් කිරීම යන තේමාව යටතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ හතරම ඇතුළත්වන පරිදි කාන්තා සංවර්ධන නිළධාරීන්, ළමා සංරක්ෂණ හා මුල් ළමාවිය සංවර්ධන නිළධාරීන්, සමාජ සේවා නිලධාරීන්, වැඩිහිටි සංවර්ධන නිළධාරි, අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්, ලිංගික තත්ව සමානත්වය සඳහා වූ නිළධාරි, ළමා හා කාන්තා පොළිස් අංශයේ නිළධාරීන්, ග්‍රාම නිළධාරීන්, ආර්ථික සංවර්ධන නිලධාරීන්, ප්‍රාදේශීය පොලිස් නිලධාරීන්, නීති ආධාර කොමිෂන් සභාවේ නීති ආධාර නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් සාකච්ඡාවන් පවත්වන ලදි.

- ❖ 13.11.2015 – 15.11.2015 වන දිනවල වීදි නාට්‍ය කණ්ඩායම සඳහා වූ පුහුණු පාඨමාලා පවත්වන ලදි.
- ❖ සමාජ ඒකාබද්ධතාවය සිදු කිරීම සඳහා නීතිය සහ ආයතන මට්ටම ජාල ශක්තිමත් කරන ලද මාතෘකා යටතේ දිස්ත්‍රික්කය සමාජ මට්ටමේ තිබුණ ගැටළු සම්බන්ධව විදහා දක්වන වීදි නාට්‍ය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස හතර තුළ පැවැත්වූහ.

**සමාජ ඒකාබද්ධතාවය භාෂාව හරහා ගොඩනැගීම -**

කිලිනොච්චි දිස්ත්‍රික්කයේ අධ්‍යාපන සංචාරය - අධ්‍යාපන අමාත්‍යාංශයේ ජාතික භාෂා හා මානව විද්‍යා අංශය ද ශ්‍රී පාලි විද්‍යාලය ද එක්ව ජාතික සමඟිය, සහජීවනය හා ජාතීන් අතර සමගිය ප්‍රවර්ධනය කිරීමේ අරමුණෙන් “දෙවන භාෂා පුහුණු කඳවුර” යන තේමාව යටතේ උතුරු පළාත දෙස පැමිණි කණ්ඩායම 16.10.2015 පස්වරු 02.30 ට පමණ කිලිනොච්චියට ළඟාවූහ. එහි විදුහල්පතිතුමා ඇතුළු ගුරුවරුන් 06 දෙනෙක් ද (පිරිමි - 03 ගැහැණු 03) වසර 10 හා 11 හි සිසුන් 65 දෙනෙක් ද පැමිණියෝය. ඉරණමඩු ජලාශය, කිලිනොච්චි නගරය, විනාශයට පත්වූ ජල ටැංකිය, අලිමංකඩ ශ්‍රී ලංකා දළ රූ පෙදෙස, යුධ හමුදා සෙබළුන්ගේ අනුස්මරණ පෙදෙස ආදී පෙදෙස් දැක බලා ගත්හ.

**ව්‍යසනයෙන් තොර ආරක්ෂා සහිත භෞතික පරිසරයකට ළඟාවන මඟ**

අමාත්‍යාංශයේ 2015 වර්ෂය සඳහා වූ “ව්‍යසනයෙන් තොර ආරක්ෂා සහිත භෞතික පරිසරයකට ළඟා වන මඟ ” යන තේමාව ළඟාවන අයුරෙන් කණ්ඩාවලෛ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශට අයත් කට්ටෛයෙක්කාඩු භාෂා සංගමයේ සාමාජිකයින්ගේ සහභාගීත්වයෙන් ශ්‍රමදාන වැඩ සටහනක් කරනු ලැබුවේය. කණ්ඩාවලෛ රජයේ මිශ්‍ර පාසල, මුත්ත විනායගර් පෙර පාසල, රාමර්, පිල්ලෛයාර් කෝවිල් (02) , ඇතුල්පටු මං සැළකිල්ලට ගන්නා ලදි. මෙහි දී භාෂා සංගම්වල සාමාජිකයින්, ග්‍රාම සංවර්ධන සමිතියේ සාමාජිකයින්, කාන්තා සංගම්, සමෘද්ධි ප්‍රතිලාභීන්, ග්‍රාසේවා නිලධාරි, සමෘද්ධි නිලධාරීන්, විදුහල්පතිතුමා හා පෙර පාසල් සිසුන්ගේ මව්පියන් ද සහභාගී වූ හ.

**ජාතික සහජීවනය, සාකච්ඡා හා රාජ්‍ය භාෂා අමාත්‍යවරයාගේ කිලිනොච්චි දිස්ත්‍රික්කයේ සංචාරය**

19.11.2015 වන දින කිලිනොච්චි දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ශ්‍රවණාගාර ශාලාවේදී ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යවරයාගේ සාකච්ඡාවක් පවත්වනු ලැබුවේය. මෙහිදී උතුරු පළාත් මධ්‍යස්ථානයේ දී ඉදි කිරීමේ කටයුතු සබැඳි ව ද අමාත්‍යාංශයේ සේවකයන් හා වැඩ සටහන් පිළිබඳව ද සාකච්ඡා කරන ලදි.

**භාෂාව හා සබැඳි කටයුතු**

- **නව නිමැවුම් ආයතනයන් ගොඩනැංවීම**

රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම හා සබැඳිව අදාළ ආයතනයන් ගොඩනැංවීම රාජ්‍ය නිලධාරීන් සඳහා වන භාෂා අයිතිවාසිකම් හා සමාජ ඒකබද්ධතා ප්‍රතිපත්තිය සම්බන්ධ දැනුවත් කිරීමේ වැඩසටහන් පූනකරි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරීන් සඳහා 2015.10.08 දින පවත්වන ලදි.

- දැනුවත් කිරීමේ වැඩමුළු

රජයේ නිලධාරීන් සඳහා වන භාෂාව අයිතිවාසිකම් හා සමාජ ඒකාබද්ධතා ප්‍රතිපත්තිය සම්බන්ධ වූ දැනුවත් කිරීමේ වැඩමුළු කරච්චි ප්‍රාදේශීය ලේකම් කාර්යලයේ නිළධාරීන් හට 2015.10.08 වන පවත්වන ලදි.

## 1. භාෂා සැලසුම

රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ වැඩ සටහන යටතේ තෝරා ගන්නා ලද ආකෘතිවලින් එකක් ලෙස කරච්චි ප්‍රාදේශීය සභාව තෝරා ගැනීම විශේෂත්වයකි.

ඒ අනුව ජාතික සංවාද අමාත්‍යාංශයේ නිළධාරීන් හට ලබා දෙන ලද භාෂා සැළසුම් බිහි කරමින් ක්‍රියාමාර්ගයකට ගෙන යාමේ පුහුණු පාඨමාලාවට අනුව මූලික පියවර වශයෙන් කරච්චි ප්‍රාදේශීය සභාවේ 15.10.2015 වන දින සාකච්ඡාවක් පවත්වන ලදි.

මෙම සාකච්ඡාවේ දී ප්‍රාදේශීය සභාවේ ලේකම් (නියෝජිත) ජ්‍යෂ්ඨ ලිපිකරු, තාක්ෂණ නිළධාරී, අනෙක් නිළධාරීන්, හා ජාතික සාකච්ඡා අමාත්‍යාංශයේ උතුරු පළාත් නිලධාරීන් ද සහභාගී වූහ. මෙම සාකච්ඡාවේ අරමුණු ලෙස රාජ්‍ය භාෂාවන් ක්‍රියාත්මක කිරීමේ රාජ්‍ය භාෂාවන් ක්‍රියාත්මක කිරීමේ වැදගත්කම හැඟවී, භාෂා සැළසුම් සකසා ක්‍රියාත්මක කිරීම සඳහා භාෂා කමිටුවක් පිහිටුවීම ආදිය වේ.

## 2. කෙටිකාලීන භාෂා පුහුණු පාඨමාලාව - දවස් 12ක පුහුණු පාඨමාලාව.

සමාජ ඒකාබද්ධතා සතිය - 2015 උදෙසා කිලිනොච්චි දිස්ත්‍රික්කය කේන්ද්‍ර කර ගනිමින් පාසැල් නිවාඩු (අ.පො.ස) උ.පෙළ විභාගයට පෙනී සිටි අයවලුන්ව සැලකිල්ලට ගෙන සිසුන් 42 ගේ සහභාගීත්වයෙන් දවස් 12 ක අඛණ්ඩ කෙටි කාලීන පුහුණු පාඨමාලාවක් නොවැම්බර් හා දෙසැම්බර් මස පවත්වන ලැබුවේය.

## 3. භාෂා සංගම්වල පොකුරු රැස්වීම්

කිලිනොච්චි දිස්ත්‍රික්කයේ කරච්චි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ලියාපදිංචි කරන ලද සියලු භාෂා සංගම් ඒකාබද්ධ කරන ලද භාෂා පොකුරෙහි සාකච්ඡාවක් දෙසැම්බර් මස ජාතික සහජීවනය, සාකච්ඡාවක් හා රාජ්‍ය භාෂා අමාත්‍යාංශයේ උතුරු පළාත් කාර්යාලයේ දී පවත්වනු ලැබුවේය.

## 5.1.13 දිස්ත්‍රික් පුහුණු මධ්‍යස්ථානයේ කටයුතු.

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පුහුණු ඒකකය හරහා නොයෙක් පුහුණු පන්තීන් 2015 වර්ෂයේ දී පවත්වනු ලැබුවේය. මෙම පුහුණු පන්තීන් වනාහි දිස්ත්‍රික් ලේකම් කාර්යලයේ නිළධාරීන්ගේ ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිළධාරීන්ගේ හැකියාවන් ප්‍රවර්ධනය කිරීමේ අරමුණෙන් සැළසුම් කර සම්මත කරන ලදි. මෙය පමණක් නොව අපගේ පුහුණු සම්පත් මධ්‍යස්ථානය හරහා අපගේ දිස්ත්‍රික් හා සිට දිස්ත්‍රික්කවල නිලධාරීන් ද ඇතුළත් කර ගෙන වර්ග කිහිපයක පුහුණු ද පවත්වන ලදි. පවත්වන ලද එක්එක් පුහුණු ප්‍රතිපත්තිවලින් ලබාගත් ඇගයීම මත තෘප්තිමත් ඉලක්ක මට්ටම 2015 වසරේ ලබා ගැනීම ආඩම්බර විය යුතු කරුණක් වේ.



කාර්යාල කාර්ය සහායකයින් සඳහා රැස්වීම් සංවිධානය කිරීම සම්බන්ධව පුහුණු පන්තිය



ග්‍රාම නිළධාරීන් සඳහා පුහුණු පන්ති



පුහුණු සඳහා සහතික ලබා දීම



කාර්යක්ෂමතා පුහුණු වැඩසටහන

## 2015 වර්ෂයේ පැවැත්වූ පුහුණු පාඨමාලා

| අංකය | පුහුණු පාඨමාලාව | සහභාගීවූවන් | පැවැත්වූ ගණන | නිලධාරීන් | සහභාගීවූ සංඛ්‍යාව | පුහුණුව සඳහා වියදම් |
|---|---|---|---|---|---|---|
| 01 | ආරම්භ පුහුණු | නව ග්‍රාම නිලධාරීන් | 01 | ප්‍රාදේශීය, දිස්ත්‍රික් ලේකම් කාර්යාල | 15 | 63,350.00 |
| 02 | මහජනතා සම්බන්ධීකරණය | සංවර්ධන නිලධාරී, කළමනාකරණ සහකාර | 01 | ප්‍රාදේශීය, දිස්ත්‍රික් ලේකම් කාර්යාල | 20 | 24,125.00 |
| 03 | රැස්වීම් සංවිධානය කිරීම | කාර්යාල කාර්ය සහායකයන් | 01 | ප්‍රාදේශීය, දිස්ත්‍රික් ලේකම් කාර්යාල | 20 | 27,630.00 |
| 04 | මිලදී ගැනීමේ ක්‍රමය | සංවර්ධන නිලධාරී, කළමනාකරණ සහකාර | 02 | ප්‍රාදේශීය, දිස්ත්‍රික් ලේකම් කාර්යාල | 40 | 31,660.00 |
| 05 | මුදල්,පාලන ක්‍රමය | සංවර්ධන නිලධාරී | 02 | ප්‍රාදේශීය, දිස්ත්‍රික් ලේකම් කාර්යාල | 60 | 47,350.00 |
| 06 | තාක්ෂණ ක්‍රමය | තාක්ෂණ නිලධාරීන් | 01 | උතුරු පළාත් නිලධාරීන් | 55 | 626,560.00 |
| 07 | ආරම්භ පුහුණු | නව කළමනාකරණ සහකාර | 01 | ප්‍රාදේශීය, දිස්ත්‍රික් ලේකම් කාර්යාල | 12 | 59,540.00 |
| 08 | පුහුණු ක්‍රියාත්මක කිරීම සම්බන්ධව | සංවර්ධන නිලධාරී, කළමනාකරණ සහකාර | 01 | ප්‍රාදේශීය, දිස්ත්‍රික් ලේකම් කාර්යාල | 40 | 45,500.00 |

## 5.1.14. විමර්ශන අංශයේ කටයුතු

විවිධ පාර්ශවයන් ගේ පැමිණිලි සම්බන්ධව මූලික පරීක්ෂණ පැවැත්වීම සඳහා කිලිනොච්චිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 05 දෙනෙකුගෙන් යුත් කමිටුවක් ලෙස විමර්ශන අංශය පත් කර ඇත. එලෙස ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා ග්‍රාම සේවා වසම් වල හා වසම් වලට අයත් ගම් වලින් ලැබෙන පැමිණිලි සම්බන්ධව මූලික පරීක්ෂණයන් ඉතාමත් කාර්යක්ෂමභාවයෙන් යුතුව ක්‍රියාත්මක කිරීම අතිරේක දිසාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් ක්‍රියාත්මක වෙමින් පවතී.

තව ද ලබා දෙන ලද පැමිණිලි විධිමත් ලෙස හා කාර්යක්ෂමතාවයෙන් යුතුව හා හැකියාවන් ප්‍රවර්ධනය කිරීමේ ක්‍රියා මාර්ග සම්බන්ධව නිසි යෝජනා උපදෙස් හා මඟ පෙන්වීම් සම්බන්ධයෙන් අතිරේක දිසාපතිතුමාගේ සහභාගිත්වය තෘප්තිමත් ලෙස කිරීම සඳහන් කළ යුතුය.

පැමිණිලි සබැඳිව නිලධාරින් සම්බන්ධ පැමිණිලි හා පක්ෂපාත චෝදනා සම්බන්ධව පැමිණිලි 18ක් ලැබුණේය.ඒ සම්බන්ධ වාර්තා යවා ඇති අතර,

- නිවාස ප්‍රතිලාභීන් තෝරා ගැනීම සම්බන්ධව පැමිණිලි 06ක්
- රජයේ ඉඩම් සම්බන්ධව පැමිණිලි 07ක්
- පොදු ආයතන සම්බන්ධව පැමිණිලි 05ක්

මේ හැර කාර්යාල පිරිසිදුව හා කාර්යක්ෂමතාවයෙන් යුතු සේවාවක් ලබා දෙන 5 එස් සංකල්පය ක්‍රියාත්මක කිරීම සබැඳිව විමර්ශන අංශය ඉතාමත් උනන්දුවෙන් කටයුතු කර ගෙන යාම දැකගත හැකිව තිබේ.

## 5.1.15 ඵලදායිතා ප්‍රවර්ධන අංශයේ කටයුතු.

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ඵලදායිතා ප්‍රවර්ධන අංශය යටතේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා අපගේ දිස්ත්‍රික්කයේ දක්නට ඇති පාසැල්, රාජ්‍ය, පෞද්ගලික, දෙපාර්තමේන්තුවල ඵලදායිතා ප්‍රවර්ධන ඒකකයේ සංකල්පය වන 5 එස් ක්‍රියාදාමය ක්‍රියාත්මක කිරීමට අපගේ අංශය සුවිශාල සහභාගීත්වයකින් ලබා දෙමින් සිටින වග සඳහන් කළ යුතුය.

නමුත් 5එස් ක්‍රියාදාමය වහාම උසස් මට්ටමේ තත්ත්වයක ගෙන ඒම සඳහා දැඩි උත්සාහයක් ගෙන ඇති නමුත් මෙම ක්‍රියා සිදු කිරීමට දීර්ළස කාලයක් අවශ්‍යවන හෙයින් 2015 වර්ෂයේ ඒ සඳහා වූ මූලික පදනම දමා 2016 වන වර්ෂයේ එහි වැඩ කොටසක් ළඟා කරගැනීමට ඵලදායිතා ප්‍රවර්ධන හා සම්බන්ධ 2015 වන වර්ෂයේ සිදු කරන ලද ක්‍රියා සැළසුම් හා සබැඳි ප්‍රගති වාර්තාව.

ජාතික ඵලදායිතා කාර්යාලයෙන් රාජ්‍ය දෙපාර්තමේන්තු, පුද්ගලික ආයතන හා පාසල් ආදීන් අතර

| ආයතන | සංඛ්‍යාව | සහභාගී වූ අය පිළිබඳ විස්තර | ක්‍රියාකාරකම් |
|---|---|---|---|
| පෙරපාසල් | 248 | 277 | 5S ක්‍රියාපිළිවෙත |
| පාසල් | 221 | 234 | 5S ක්‍රියා පිළිවෙත, ප්‍රමිත කවය හරිත නිෂ්පදනය |
| ග්‍රාම සේවා වසම් | 32 | 34 | 5S ක්‍රියා පිළිවෙත, ප්‍රමිත කවය හරිත නිෂ්පදනය |
| රාජ්‍ය ආයතන | 153 | 161 | 5S ක්‍රියා පිළිවෙත, ප්‍රමිත කවය හරිත නිෂ්පදනය |
| පුද්ගලික ආයතන | 19 | 20 | 5S ක්‍රියා පිළිවෙත, ප්‍රමිත කවය හරිත නිෂ්පදනය |
| ගම් | 163 | 163 | 5S ක්‍රියා පිළිවෙත, ප්‍රමිත කවය හරිත නිෂ්පදනය |
| ඵලදායිතා සංවර්ධන ආයතන | 04 | 04 | 5S ක්‍රියා පිළිවෙත, ප්‍රමිත කවය හරිත නිෂ්පදනය |

සම්මාන තරඟාවලි පැවැත්වීම සම්බන්ධ ව වැඩටහනක් 2015.02.69 වන දින කිළිනොච්චි දිස්ත්‍රික් ලේකම් කාර්යාල ශ්‍රවණාගාරයේ දී පවත්වන ලදි.

- ❖ ඉන් පසු පාසැල් හා පුද්ගලික ආයතනයන්ගෙන් මෙම තරඟාවලි සඳහා අයදුම්පත් සම්පූර්ණ කර යවා තබන ලදි. තවද මේ තරඟාවලියේ කිළිනොච්චි ලංකා බැංකුවට විශේෂ සුභපැතුම් ලැබුණි.
- ❖ තවද කිළි/ මුරුගානන්දා විදුහල ගුණාත්මක කවය තරඟාවලියේ තුන්වන ස්ථානය ලැබුවේ ය.

අපගේ දිස්ත්‍රික්කය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ද ඵලදායිතා කටයුතු වේගයෙන් සිදු කරගෙන යනු ලබන අතර, ඵලදායිතා සම්මාන තරඟාවලියේ ද ජයග්‍රහණය කිරීමට අදාළ කටයුතු කරගෙන යනු ලබයි.

## 5.1.16 ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැළසුම් දෙපාර්තමේන්තුවේ කටයුතු.

### ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැළසුම් දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් මට්ටමේ ක්‍රියාකාරකම්

### වැදගත්කම

දිවයිනේ භූමි සම්පත ඉතාමත් විශිෂ්ට ලෙස යොදා ගැනීම දිරිමත් කිරීම දෙපාර්තමේන්තුවේ අරමුණ වේ. මෙම අරමුණ සිතෙහි රඳවා ක්‍රියාත්මක කර ගෙන යන නොයෙක් සේවාවන් දෙපාර්තමේන්තුව විසින් ඉටු කරනු ලබයි. එය දිවයිනේ භූමි සම්පත ඉතාමත් විශිෂ්ට ලෙස උපයෝගී කර ගැනීමට සාමූහික ව මහ පෙන්වයි.

**සේවාවේ සැළසුම් කටයුතු පහත සඳහන් කර ඇත.**

- නොයෙක් තරාතිරම්වල ඉඩම් පරිහරණ සැළසුම් ක්‍රම.
- ඉඩම් තක්සේරු කිරීම හා භූමියේ ගැලපීම තීරණය කිරීම.
- භූමි සම්පත් සම්බන්ධ තොරතුරු මධ්‍යස්ථානයක් පිහිටුවීම.
- ඉඩම් තොරතුරු බැංකුව
- ඉඩම් පරිහරණ සැළසුම් කමිටුව
- සිතියම් සංකීර්ණයක්

| අනු අංකය | වැඩසටහන | ස්ථානය | මුදල් ප්‍රතිපාදන | වියදම් |
|---|---|---|---|---|
| 01 | පාසල් මට්ටමේ හා ග්‍රාම මට්ටමේ ඉඩම් පරිහරණ දැනුවත් කිරීම. | කිළිනොච්චි දිස්ත්‍රික්කය | 12,000.00 | 11,960.00 |
| 02 | ග්‍රාමීය මට්ටමේ ඉඩම් පරිහරණය | කණ්ඩාවලෙ- මයිල්වාහනපුරම් කරච්චි- අම්බාල්කුලම් | 400,000.00 | 393,045.00 |
| 03 | කැබලි මට්ටමේ ඉඩම් පරිහරණය | කරච්චි- තිරුවෙයාරු ම.වි | 150,000.00 | 149,800.00 |
| 04 | තත්ත්වය අහිමි වූ ඉඩම් උපයෝගීත්වය. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය- කිලිනොච්චිය | 75,000.00 | 75,000.00 |

| | | | | |
|---|---|---|---|---|
| 05 | ප්‍රාදේශීය මට්ටමේ ඉඩම් පරිහරණ කමිටු රැස්වීම. | පච්චිලෛපල්ලි-ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 12,000.00 | 10,000.00 |
| 06 | දිස්ත්‍රික් මට්ටමේ ඉඩම් පරිහරණ කමිටු රැස්වීම. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 12,000.00 | 9,035.00 |
| 07 | ජාතික ඉඩම් පරිහරණ වැඩසටහන | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 100,000.00 | – |
| 08 | ජල ආධාර සම්බන්ධව සිතියම් වැඩසටහන | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 200,000.00 | 109,209.30 |
| 09 | Vana Ropa ගස් හිටවීමේ වැඩසටහන | කරච්චි, කණ්ඩාවලෙෙ, පූනකරි | 100,000.00 | 100,000.00 |

**ඉඩම් පරිහරණ හා සැළසුම් ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් මට්ටමේ ක්‍රියාකාරකම්**

**විශේෂ වැඩසටහන LLRC**

උගත් පාඩම් හා ප්‍රතිසංදාන කොමිසන් සභාවේ නිර්දේශයේ පස සම්පත සරුසාරවත් භාවයේ අඩු නොවන අයුරින් පරිහරණය කිරීමට ගන්නා ලද ක්‍රියාවට පහසුව සලසා දීම සඳහා ඉඩම් පරිහරණ සැළසුම උපයෝගී කර ගැනීමෙහිලා වැදගත්කම අවධාරණ කරන ලදි. සැළසුම් කටයුතු ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවට ලබා දී තිබේ.

## 5.2 සමාජ සේවා හා සංස්කෘතික ප්‍රවර්ධනය

### 5.2.1 සංස්කෘතික අංශයේ කටයුතු

කිලිනොච්චි දිස්ත්‍රික් සංස්කෘතික සම්මුතිය විසින් මෙම දිස්ත්‍රික්කයේ පෞරාණිකත්වයේ මූලය යන ග්‍රන්ථය 2015.02.12 වන දින දිසාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් එළි දක්වන ලදි. එළි දැක්වීමේ උත්සවයට ප්‍රධාන අමුත්තා ලෙස උතුරු පළාත් ප්‍රධාන ලේකම් තුමා සහභාගි වී ග්‍රන්ථය එළි දැක්වූහ. මෙම උත්සවයේ දී කලාකරුවන්, සංස්කෘතික සම්මුතියේ සාමාජිකයින්, සාහිත්‍යකරුවන් ආදී නොයෙක් අයවලුන් සහභාගි වූහ.

නේත්‍රා රූපවාහිනි සේවයේ සිංහල දෙමළ අළුත් අවුරුදු උත්සව 2015.04.14 වන දින පෙරවරුවේ මලයාල්පුරම් මුත්තුමාරි අම්මන් දේවස්ථානයේ පූජා වතාවත්ගෙන් ද කලා වැඩසටහන්ද පවත්වනු ලැබුවේය. මෙම උත්සවයට අතිරේක දිසාපතිතුමා හා කරච්චි ප්‍රාදේශීය ලේකම්තුමා, දිස්ත්‍රික් සංස්කෘතික නිලධාරිතුමා,ප්‍රාදේශීය සංස්කෘතික නිලධාරින් ද කලාකරුවන්, සිසුන් ආදී නොයෙක් අයවලුන් සහභාගී වූහ. මෙය අවශ්‍ය මූල්‍යාධාර අදාළ රූපවාහිනී ආසන්නයේ සැපයුවේ ය.

උතුරු පළාත් සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ මූල්‍යාධාර යටතෙ මෙම දිස්ත්‍රික් දිසාපති තුමාගේ ප්‍රධානත්වයෙන් 2015.06.04 වන දින පවත්වන ලදි.

2015.07.17 වන දින සංස්කෘතික දෙපාර්තමේන්තුවේ දැනුවත් කිරීමට අනුව ජුලි මස උදාවීමේ උත්සවය (ආඩිප්පිරප්පු) පවත්වන ලදි. මෙයට රුපියල් 20,00.00ක් දෙපාර්තමේන්තුව විසින් වෙන් කර තිබුණේය.මෙම උත්සවයේ ආඩිකූල් නමැති කැඳ පිස නිලධාරීන්ට හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට පැමැණ අයවලුන්ට ද දෙන ලදි. ජුනි මාසයේ උදාවීමේ විශේෂත්වය සම්බන්දව විශ්‍රාමික ගුරුතුමිය වන ප. සිවනොලිපාදම් මහත්මිය විසින් දේශනයක් පවත්වන ලදි.

උතුරු පළාතේ සංස්කෘතික උත්සවය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අනුග්‍රහයෙන් මෙම දිස්ත්‍රික්කයේ සමූපකාර සංස්කෘතික මණ්ඩලයේ දී සැප්තැම්බර් මස 23,24 වන දිනයන්හි පවත්වන ලදි. මෙම උත්සවයේ වියදම් දැරීම සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට දෙපාර්තමේන්තුවෙන් රුපියල් 829,822.50 ක වෙන් කර තිබුණේය. මෙම උත්සවයට ගරු අධ්‍යාපන අමාත්‍යවරයා, පාර්ලිමේන්තු නියෝජිතයින්, උතුරු පළාත් ප්‍රධාන ලේකම්, දිස්ත්‍රික්කයේ ලේකම් තුමා ,අතිරේක දිසාපති, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන ගණකාධිකාරී,උතුරු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්, සංස්කෘතික නිළධාරි, ප්‍රාදේශීය සංස්කෘතික නිළධාරි, කලාකරුවන්, සිසුන්, සාහිත්‍යකරුවන් හා පොදු ජනතාව ආදි නොයෙක් අයවලුන් සහභාගි වූහ.

## සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව - මධ්‍යම රජය

කිලිනොච්චි දිස්ත්‍රික් පාසැල් සිසුන් අතර 2015.11.15 වන දින රාජ්‍ය නැටුම් තරඟයක් ශාන්ත තිරේසා කිතුණු සේවා මධ්‍යස්ථාන ශාලාවේදී පවත්වනු ලැබුවේ ය. මෙහි සිසුන් හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සංස්කෘතික සංවර්ධන නිලධාරීන්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සංස්කෘතික සංවර්ධන නිලධාරීන් සහභාගී වූහ. මෙයට දෙපාර්තමේන්තුව විසින් රුපියල් 15,000.00 මුදලක් වෙන් කර තිබුණේය.

මෙම දිස්ත්‍රික්කයේ කලා හා සාහිත්‍ය සභාවන් හා පාසැල් සිසුන් අතර පවත්වන ලද සාහිත්‍ය නිමැවුම් තරඟයේ ත්‍යාග පිරිනැමීමේ උත්සවය 2015.11.20 වන දින දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ශ්‍රවණාගරයේ දී පවත්වණු ලැබුවේ ය. මෙම උත්සවයට දිසාපති තුමා දිස්ත්‍රික් සංස්කෘතික නිළධාරී සංස්කෘතික සංවර්ධන නිළධාරීන් ත්‍යාග හිමි සිසුන් හා කලාකරුවන් ද, සහභාගි වූහ. මෙයට දෙපාර්තමේන්තුව විසින් රුපියල් 25,000ක මුදලක් ලබා දුන් බව සඳහන් කළ යුතුය.

## හින්දු ආගමික සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

13.01.2015 වන දින පෝප්තුමාගේ පැමිණීම උදෙසා මෙම දිස්ත්‍රික්කයේ සිට හින්දු පූජකවරුන් සය දෙනෙක් කොළඹට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හින්දු සංස්කෘතික සංවර්ධන නිළධාරිණී සි. ක්‍රිෂ්ණකුමාරි කරච්චි ප්‍රාදේශීය හින්දු සංස්කෘතික නිළධාරිණී සි.ජෙයමදි යන අයවලුන් විසින් කැඳවා ගෙන යන ලදි.

මෙම දිස්ත්‍රික්කයේ දහම් පාසල් ගුරුවරුන් සඳහා වූ පුහුණු වැඩමුළුවක හා නිළ ඇඳුම් බෙදා දීම ද 2015.02.22 වන දින දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සමූහ ශාලාවේ දී පවත්වන ලදි. මෙයට හින්දු ආගමික සංස්කෘතික දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂිකා හේමලෝජිනි කුමරන් මහත්මියගේ ප්‍රධානත්වයෙන් මෙම උත්සව පවත්වනු ලැබුවේය. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන කළමණාකරණ සහකාර සරෝජිනී කුගරාසා මහත්මිය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හින්දු සංස්කෘතික සංවර්ධ නිළධාරිණී සි. ක්‍රිෂ්ණකුමාරි මහත්මිය යන අයවලුන් සහභාගිවූහ.

හින්දු කෝවිල්වල කාරක සභිකයන්ගේ වැඩමුළුවක් හා කෝවිල් පරිපාලනය හා සබැඳි මාර්ගෝපදේශ අත්පත්‍රිකා බෙදා දීමේ දී 2015.03.07 වන දින සමූපකාර සංස්කෘතික ශාලාවේ පවත්වණු ලැබුවේය.

හින්දු ආගමික දහම් පාසල්වල 25 වන වසර පිරීම නිමිත්තෙන් දහම් පාසල් සිසුන් අතර දිස්ත්‍රික් මට්ටමේ කථා, නාට්‍ය ,නර්ථන, විල්ලුප්පාට්ටු, ගාථා , රචනා ,චිත්‍ර ආදි තරඟ පවත්වන ලදි.

කිලිනොච්චි කන්දසාමි කෝවිලේ 2015.01.15 වන දින පවත්වන ලද තෛ පොංගල් උත්සවයට රු.5,000.00ක් ලබා දෙන ලදි.

උරුත්තිරපුරම් සමන් කෝවිලේ මහා ශිවරාත්‍රි දිනය පෙබරවාරි 17වන දින උපවාස අධිෂ්ඨාන කරන ලදි. මෙයට රුපියල් 5,00.00ක් දෙපාර්තමේන්තුව විසින් ලබා දෙන ලදි.

## ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය.

කිලිනොච්චි දිස්ත්‍රික්කයේ ඇති මීසාම් දේවාස්ථානවල 50ක ඇති ඉරිදා දින දහම් පාසල් 35ක ගුරුවරුන්හට නිළ ඇඳුම් හා වැටුප් දීමනා රුපියල් 5200.00 බැගින් ජනවාරි මස අවසානයේ මීසාම් භාර පියතුමා හට භාර දී අදාළ අයවලුන්හට ලබා දෙන ලදි. මෙයට අවැසි මුදල් දෙපාර්තමේන්තුව විසින් පිළියෙළ කර ලබා දුන් බව සඳහන් කළ යුතු ය.

මෙම දිස්ත්‍රික්කයේ පූනකරි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට පාලෛතීවු ශාන්ත අන්තෝනි මුන්දුන්ගේ දේවස්ථානය 2015.02.28 වන දින ද මන්නිත්තලෙ ශාන්ත සෙබස්තියාර් දේවස්ථානය 2015.08.30 වන දින ද ආදී වශයෙන් දේවස්ථාන දෙකෙහි ම ගැසට් දැන්වීම අනුව උත්සව පැවත්වීමට කටයුතු සංවිධානය කරනු ලැබුවේ ය.

## 5.2.2 මුල් ළමාවිය සංවර්ධන අංශයේ කටයුතු.

මුල් ළමා විය සංවර්ධනය යනු ළමුන්ගේ භෞතික තත්ත්වය , මානසික ප්‍රවර්ධනතාවය, සමාජ වර්ධන හා දැනුම් වර්ධනය ආදිය එක් රැස්කරන ලද පූර්ණ පිළිවෙතක් අනුගමනය කිරීම වේ. මෙහි අරමුණු ළමුන්ගේ ශාරීරික හා මානසික වර්ධය හා පැහැදිලි මානසික තත්ත්වයෙන් හා යහපත් සිරිත් විරිත්වලින් හා පාසලට යාමේ තත්වයට ඔවුන් ව සූදානම් කිරීම වේ.

කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ ළමා කාර්යාලය විසින් දිවයින පුරා සිටින ළමුන්ව සැළකිල්ලට ගෙන පහත සඳහන් කටයුතු ක්‍රියාත්මක කරයි.

**ප්‍රධාන ක්‍රියාකරකම්.**

- පෙරපාසල් ළමුන්හට පිරිසිදු ගව කිරි ලබා දීම.
- ගැබිණි මව්වරුන් සඳහා පොදි (පැකේජ්) රු.20,000ක ලබා දීම.
- දරු දැරියන්හට එරෙහි දූෂණ හා ප්‍රචණ්ඩ ක්‍රියාවලින් මුදා හැරීමට පෙර ආරක්ෂණයක් ලබා දීම.
- පෙර පාසල් ගුරුවරුන් සඳහා මාසික වැටුප් 250ක් ලබා දීම.
- ලෝක ළමා දිනය හා ළමා සෙනෙහෙ පරිසරයක් උදාකිරීමේ වැඩසටහන.
- මුල් ළමා වියේ ආරක්ෂාව හා සංවර්ධන වැඩ සටහන්

| අංක | ක්‍රියාත්මක කළ වැඩසටහන | භෞතික | ප්‍රතිපාදන | වියදම් | ඉතිරිය | ප්‍රතිලාභීන් |
|---|---|---|---|---|---|---|
| 01 | නිවාස මූලික කරගත් ළමා සෙනෙහෙ පරිසරයක් උදා කිරීම | 100 | 24,000.00 | 24,000.00 | - | 193 |
| 02 | පෝෂණ ආහාර ලබා දීම - මව්පිය ගුරු දැනුවත් කිරීම්. | 100 | 20,000.00 | 20,000.00 | - | 139 |
| 03 | නැණ දීපනි - පෙරපාසල් ගුරුවරුන් සඳහා පුහුණුව | 100 | 20,000.00 | 20,000.00 | - | 77 |
| 04 | මුල් ළමා සතිය - දැනුවත් කිරීම | 100 | 60,000.00 | 60,000.00 | - | 405 |
| 05 | ක්‍රීඩා මිදුල සැකසීම. | 100 | 50,000.00 | 50,000.00 | - | 26 |
| 06 | දැරියන්ගේ දිනය. | | 20,000.00 | 19,955.00 | 45.00 | 154 |
| 07 | ලෝක ළමා දිනය | 100 | 50,000.00 | 47,875.00 | 2,125.00 | 425 |
| 08 | අරුණ දකින රටා චිත්‍ර තරඟය | 100 | 60,000.00 | 52,000.00 | 8,000.00 | 372 |
| 09 | පිරිසිදු ගවකිරි ලබා දීම. | 100 | 10,347,227.00 | 10,317,351.00 | 29,876.00 | 4,776 |
| 10 | ගැබිණි මව්වරුන් සඳහා පොදි 20,000ක් ලබා දීම | 100 | 14,874,000.00 | 14,712,000.00 | 162,000.00 | 1,226 |
| 11 | ගුරු දීමනා | 100 | 84,000.00 | 84,000.00 | 0 | 48 |
| | එකතුව | | 25,609,227.00 | 25,407,181.00 | 202,046.00 | |

## 5.2.3 ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ කටයුතු

## ළමුන් හ සබැඳිව කරන ලද කටයුතු - 2015

ජාතික ළමා ආරක්ෂණ අධිකාරිය වනාහි ළමුන් හා සබැඳි ජාතික හා ජාත්‍යන්තර ප්‍රතිපත්තිවලට එකඟව ළමුන්ගේ උසස් යහපත සුරැකීමට ක්‍රියාත්මක වෙමින් සිටියි. අධිකාරිය වනාහි ළමුන්ගේ ආරක්ෂාව මානසික සමාජ වර්ධනය ආදිය තහවුරු කරන අයුරින්ද ළමුන්ට ඇතිවන සියලුම දූෂණයන්ගෙන් ආරක්ෂා කිරීමට අරමුණු කරගෙන ක්‍රියාත්මක වෙමින් පවතින, තව ද ඇඩි ලෙස පීඩාවට ලක්වන හා දූෂණයන්ට ලක්වන ළමුන්හට ක්ෂණික විසඳුම්ක ලබා දීම උදෙසා විශේෂ ආධාර ලබා දෙන ආයතනයක් ලෙසද පවතී. 1929 යන ළමා ආධාර දුරකථනය මඟින් දිවයිනේ සියලුම පෙදෙස්වල සිට ළමුන් හා සබැඳි පැමිණිලි ලබා ගෙන විසඳුම් ක්‍රියාමාර්ගයන් කරගෙන යනු ලබයි. තවද, ළමුන්ගේ ආරක්ෂා කටයුත් කිරීම උදෙසා ළමුන්, දෙමාපියන් රාජ්‍ය හා රාජ්‍ය නොවන නිළධාරීන් ද දැනුවත් කිරීම සිදු කරනු ලැබේ. දෙමාපියන් සවිබල ගැන්වීම සමාජීය කටයුතු සිදු කිරීම වැනි කටයුතු ද ළමුන් වෙනුවෙන් හා ළමුන් හා සේවයේ යෙදී සිටින ආයතනය වශයෙන් ද කර ගෙන යයි.

ජාතික ළමා ආරක්ෂණ අධිකාරිය වනාහි ළමුන් හා සබැඳිව පහත සඳහන් ක්‍රියාකාරකම් කිලිනොච්චි දිස්ත්‍රික්කයේ සිදු කරන ලදි.

| අංක | ක්‍රියාත්මක කළ ව්‍යාපෘති | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | සංඛ්‍යාව | වටිනාකම (රුපියල්) |
|---|---|---|---|---|
| 01 | ළමා නිවාස වල සිටින ළමුන්ව හදිසි අනතුරු වලින් වළක්වාලීම. | කරච්චි | 05 | 58,200.00 |
| 02 | සිවිල් සමාජ නායකයින් පුහුණු කිරීම. | කරච්චි | 01 | 22,500.00 |
| 03 | සුරංගනාවියන්ගේ ජාලය සාමාජිකයින් දැනුවත් කිරීමේ වැඩ සටහන. | කරච්චි<br>කණ්ඩාවලෛ<br>පූනකරි පලෛ | 12 | 92,000.00 |
| 04 | සතුට හා දුක පිළිබිඹු කරන පැමිණිළි පෙට්ටිය. | කරච්චි<br>කණ්ඩාවලෛ<br>පූනකරි පලෛ | 70<br>පාසල් | 20,413.00 |
| 05 | දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ළමා ආරක්ෂණ නිලධාරීන්ගේ මාසික සාකච්ඡා | කරච්චි<br>කණ්ඩාවලෛ<br>පූනකරි පලෛ | 07 | 14,000.00 |

## 5.2.4 .උපදේශන කටයුතු

| උපදේශන මධ්‍යස්ථාන | පුද්ගලික උපදේශන මධ්‍යස්ථාන | පවුල් උපදේශණ | දැනුවත්කිරීමේ වැඩසටහන් | පුහුණු පාඨමාලා |
|---|---|---|---|---|
| | පුද්ගලයින් සංඛ්‍යාව | පවුල් සංඛ්‍යාව | වැඩසටහන් සංඛ්‍යාව | |
| දිස්ත්‍රික් උපදේශන මධ්‍යස්ථානය | 21 | 45 | 27 | 12 |
| කරච්චි උපදේශන මධ්‍යස්ථානය | 50 | 09 | 04 | 02 |
| පච්චිලෙප්පල්ලි උපදේශන මධ්‍යස්ථානය | 27 | 32 | 01 | - |
| එකතුව | 98 | 86 | 32 | 14 |

පාසැල් මට්ටමේ සිසුන් දැනුවත් කිරිමේ වැඩ සටහන් පවත්වන ලදි. මෙම දැනුවත් කිරීමේ වැඩ සටහන් පහත සඳහන් කරුණු ඇතුළත් කරමින් පවත්වන ලදි.

- අධ්‍යයන හැකියාවන් ප්‍රවර්ධනය කිරීම
- ළමා ලිංගික අපහරණ හා එය වැළැක්වීම.
- යහපත් ක්‍රමවලින් නවීන තාක්ෂණය උපයෝගී කර ගැනීම
- ප්‍රචණ්ඩත්වයෙන් තොර සන්නිවේදනය.

මෙලෙස ග්‍රාමීය මට්ටමේ ද මානසික සමාජ ප්‍රශ්න අවම කිරීම අරමුණු කර ගනිමින් පහත සඳහන් කරුණු හා සබැඳි දැනුවත් කිරීමේ වැඩ සටහන් පවත්වන ලදි.

- මානසික හා සමාජ ප්‍රශ්න හා එය වැළැක්වීම.

- ළමුන් හදා ගන්නා ක්‍රම වල මානසික සමාජ දැක්ම
- දෙමාපියන් සබැඳි හැකියාවන් හා නිවාස ප්‍රචණ්ඩත්වය.
- විවාහයට පෙර වූ උපදේශන සහාය
- උපදේශන යහපත හා විශේෂ අවශ්‍යතාවයන් ඇති අයවලුන්.

මෙලෙස උපදේශන සහයට අයත් නොයෙක් පුහුණු වැඩමුලු පවත්වන ලදි. මෙය රාජ්‍ය සේවකයන්, ග්‍රාමීම මට්ටමේ ආයතනයන්, කර්මාන්ත පුහුණු අධිකාරියේ පුහුණුකරුවන්, විශේෂ අවශ්‍යතාවයන් ඇති අයවලුන් කේන්ද්‍ර කර ගනිමින් පවත්වන ලදි. එම පුහුණු වැඩ මුළු පහත සඳහන් කරුණු ඇතුළත් කර තිබීම දැකිය හැකිය.

- ළමා සංවර්ධන මානසික සමාජ දැක්ම.
- යහපත් පුද්ගල මානසිකත්වය.
- පුද්ගලයන් අතර සන්නිවේදනය.
- වැඩිහිටියන්ගේ මානසික යහපත තේරුම් කර ගැනීම.
- ආපදා කාලයන්හි මානසික සමාජ ප්‍රථමාධාර

## 5.2.5 කාන්තා සංවර්ධනය සබැඳි කටයුතු

කාන්තා අමාත්‍යාංශය වනාහි දිවයිනේ ජාතික හා ඔවුන්ගේ ප්‍රවර්ධනය හා සබැඳි නොයෙක් වැඩසටහන් කරගෙන යනු ලබයි.

මේ අනුව සියලුම ගම්මානයන්හි කාන්තා කටයුතු කමිටු පිහිටුවා ඒ හරහා නොයෙක් දැනුවත් කිරීමේ වැඩසටහන් ජීවිතාධාර හා නොයෙක් පුහුණු පාඨමාලාවන් වැඩමුළු ආදී නොයෙක් වැඩ සටහන් කරගෙන යනු ලබයි.

කිලිනොච්චි දිස්ත්‍රික්කය වනාහි කාන්තා ගෘහ මූලික පවුල් 706ක් තිබේ. කාන්තා කටයුතු කමිටු 93ක් පිහිටුවා තිබේ. යුද්ධයෙන් ස්වාමී පුරුෂයන් අහිමිවූ වැන්දඹු ගෘහ මූලික පවුල් ද සැළකිල්ලට ගෙන ඔවුන් සඳහා ජීවනෝපාය ආධාර සහනාධාර මත හා ණය කව මත ලබා දෙනු ලබයි. තව ද පසුගිය වසරේ

කාන්තා හා ගෘහ මූලික පවුල් සඳහා වන ජාතික මධ්‍යස්ථානය කිලිනොච්චි දිස්ත්‍රික්කයේ ද පිහිටුවා නොයෙක් වැඩ සටහන් ක්‍රියාත්මක කරනු ලබයි.

**2015 වර්ෂයේ කාන්තා කටයුතු අමාත්‍යාංශය විසින් අපගේ දිස්ත්‍රික්කයට සිදු කළ වැඩසටහන් පහත සඳහන් වේ.**

| අංක | විස්තරය | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | සංඛ්‍යාව | වටිනාකම (රු) |
|---|---|---|---|---|
| 01 | කාන්තා දිනය | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය 04 දිස්ත්‍රික් ලේකම් කාර්යාලය 01 | 05 | 75000.00 |
| 02 | ජීවිතාධාර | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය 04 | 04 | 720,000.00 |
| 03 | කාන්තා මූලිකත්ව පවුල්වල ආර්ථික සංවර්ධන වැඩසටහන් | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 01 | 722,875.00 |
| 04 | යුද්ධයෙන් හානි වූ වැන්දඹුවන් සඳහා ජීවිතාධාර | කණ්ඩාවලෙ කරච්චි | 02 | 60000.00 |
| 05 | ජීවිතාධාර | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 | 04 | 720,000.00 |
| 06 | දැනුවත් කිරීම් | පූනකරි | 01 | 12500.00 |
| 07 | හැකියා වර්ධන පුහුණු වැඩසටහන් | කණ්ඩාවලෙ කරච්චි | 02 | 100000.00 |
| 08 | කාන්තා මූලිකත්ව පවුල් සංවර්ධනය කිරීම සඳහා ජාතික මධ්‍යස්ථානය පුනරුත්ථාපනය | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 01 | 800000.00 |
| 09 | දැනුවත්කිරීම 11 | පූනකරි | 01 | 112500.00 |
| 10 | කාන්තා දිරිගැන්වීමේ වැඩසටහන් | දිස්ත්‍රික් ලේකම් | 01 | 90,511.00 |

| | | | | |
|---|---|---|---|---|
| | | කාර්යාලය | | |
| 11 | මුලංකවිල් පොලිස්ථානයේ ළමා, කාන්තා අංශ සඳහා වැසිකිළිය නිර්මාණය | පූනකරි | 01 | 300,000.00 |
| 12 | කාන්තා මගපෙන්වීම් පුහුණු | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 01 | 30000.00 |
| 13 | පිරිමි ගැහැණු ලිංගික තත්වය සබැඳි ප්‍රචණ්ඩත්වය මිනිසුන්ව විකිණීම වැනි දෑ වලක්වාලීම සබැඳි වැඩමුළු | කරච්චි | 01 | 25000.00 |
| 14 | පෝෂණ වැඩසටහන් | කණ්ඩාවලෙ | 01 | 37650.00 |
| 15 | දහඅටෙන් පහළ කාන්තාවන්ට හැකියා වර්ධන දැනුවත්කිරීම් | කරච්චි | 01 | 40000.00 |
| 16 | ජීවිතාධාර | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය 04 | 04 | 53,40,000.00 |
| 17 | කාන්තා මූලිකත්ව පවුල් සංවර්ධනය කිරීම සඳහා ජාතික මධ්‍යස්ථානය විවෘත කිරීම | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 01 | 750,175.00 |
| 18 | ජාතික මධ්‍යස්ථානය විවෘත කිරිම සඳහා ගමන් වියදම් දීමනා | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 01 | 56000.00 |
| 19 | කාන්තා මූලිකත්ව පවුල් සංවර්ධනය කිරීම සඳහා ජාතික මධ්‍යස්ථානයේ ජනෙල් සඳහා ග්‍රීල් සවිකිරීම | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 01 | 125000.00 |

## 5.2.6 සමාජ සේවා කටයුතු

**පොදු ජන මාසික දීමනා**

මෙම දීමනාව බොහෝ දිළිඳු පවුල්වලට ඔවුන් වාසයකරන්නාවූ තැපැල් කාර්යාල මඟින් ලබා දීම පහත සඳහන් පරිදිය.

01 සාමාජිකයෙක් සිටින පවුල්සඳහා රු.250 බැගින්
02 සාමාජිකයන් සිටින පවුල්සඳහා රු.300 බැගින්
03 සාමාජිකයන් සිටින පවුල්සඳහා රු.350 බැගින්
04 සාමාජිකයන් සිටින පවුල්සඳහා රු.400 බැගින්
05 සාමාජිකයන් සිටින පවුල්සඳහා රු.450 බැගින්
06 සාමාජිකයන් සිටින පවුල්සඳහා රු.500 බැගින්

**ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමේ 2015 වන වර්ෂයේ ලබා දුන් දීමනා විස්තරය පහත සඳහන් වේ.**

| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | සංඛ්‍යාව | ප්‍රතිලාභීන් |
|---|---|---|
| කරච්චි | 13,920,000 | 3,350 |
| කණ්ඩාවලෛ | 7,800,000 | 2,063 |
| පච්චිලෛපල්ලි | 3,000,000 | 8,51 |
| පූනකරි | 6,000,000 | 1,624 |
| **එකතුව** | **30,720 000** | **7,888** |

## 01) රෝගීන් සඳහා දීමනා

### 1.ක්ෂය රෝගය

- රෝගියාට දීමනාවක් සඳහා රු.250 බැගින් ඔහුගේ බිරිඳ සඳහා රු.100 බැගින්
- ඔහුගේ බාරකාරත්වයෙන් අවුරුදු 18ට අඩු ළමුන් සිටී නම් එක් අයෙක්ට රු.50 බැගින්
- උපරිම වශයෙන් රු 500 ලබා දීම.

### ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමේ 2015 වර්ෂයේ ලබා දුන් දීමනා විස්තර

| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | සංඛ්‍යාව | ප්‍රතිලාභීන් |
|---|---|---|
| කරච්චි | 79200 | 11 |
| කණ්ඩාවලෛ | 7200 | 01 |
| පච්චිලෛපල්ලි | 28800 | 4 |
| පූනකරි | ---- | - |
| **එකතුව** | **115 200** | **16** |

## 2. පිළිකා

මෙම රෝගීන් සඳහා දීමනාව රු.600 බැගින් ඔවුන් ජීවත් වන ප්‍රදේශයේ උප තැපැල් කාර්යාලය මගින් ලබා ගැනීම සඳහා පැමිණෙයි

### ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමේ 2015 වර්ෂයේ ලබා දුන් දීමනා විස්තර

| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | සංඛ්‍යාව | ප්‍රතිලාභීන් |
|---|---|---|
| කරච්චි | 936,000 | 130 |
| කණ්ඩාවලෛ | 336,000 | 47 |
| පච්චිලෛපල්ලි | 151,200 | 21 |
| පූනකරි | 115,200 | 16 |
| **එකතුව** | **1,538,400** | **214** |

## 3. වකුගඩු රෝගීන්

මෙම රෝගීන් සඳහා රු.600 බැගින් ඔවුන් ජීවත් වන ප්‍රදේශයේ උප තැපැල් කාර්යාලය මගින් ලබා ගැනීම සඳහා පැමිණෙයි.

### ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමේ 2015 වර්ෂයේ ලබා දුන් දීමනා විස්තර

| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | සංඛ්‍යාව | ප්‍රතිලාභීන් |
|---|---|---|
| කරච්චි | 46,800 | 78 |
| කණ්ඩාවලෛ | 7,200 | 12 |
| පච්චිලෛපල්ලි | 1,200 | 2 |
| පූනකරි | 6,000 | 10 |
| එකතුව | **61,200** | **102** |

## 02) වැඩිහිටියන් සඳහා දීමනාව

වයස අවුරු 70 න් ඉහළ වැඩිහිටි දීමනාව සඳහා රු.2000ක් ඔවුන් ජීවත් වන ප්‍රදේශයේ උප තැපැල් කාර්යාලය මඟින් ලබා ගැනීම සඳහා පැමිණෙති.

**ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමේ 2015 වර්ෂයේ ලබා දුන් දීමනා විස්තර**

| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | සංඛ්‍යාව | ප්‍රතිලාභීන් |
|---|---|---|
| කරච්චි | 1,168,200 | 1,947 |
| කණ්ඩාවලෛ | 406,800 | 678 |
| පච්චිලෛපල්ලි | 199,200 | 332 |
| පූනකරි | 301,200 | 502 |
| එකතුව | **2,075,400** | **3,459** |

## 03) ආබාධිත පුද්ගයලයන් සඳහා උපකාර සංඛ්‍යාව

ඉතා දිළිදු ආබාධිත පුද්ගලයින්ගේ පවුල් සඳහා එක් ප්‍රතිලාභියෙකුට රු.3000ක් බැගින් පහත සඳහන් පරිදි ලබා ගැනීම සඳහා පැමිණෙති.

**ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමේ 2015 වර්ෂයේ ලබා දුන් දීමනා විස්තර**

| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | සංඛ්‍යාව | ප්‍රතිලාභීන් |
|---|---|---|
| කරච්චි | 4,248,000 | 118 |
| කණ්ඩාවලෛ | 4,140,000 | 115 |
| පච්චිලෛපල්ලි | 4,176,000 | 116 |
| පූනකරි | 4,500,000 | 125 |
| **එකතුව** | **17,064,000** | **474** |

## 04) තනි පුද්ගලයන් පවුල් නායක වශයෙන් සිටින පවුල් සඳහා ස්වයං රැකියා දීමනා

තනි පුද්ගලයන් පවුල් නායක වශයෙන් සිටින පවුලේ පවුල් නායකයා නැතහොත් පවුල් නායිකාව නොමැති අවස්ථාවක එම පවුල් සඳහා ස්වයං රැකියා ආධාර දීමනාව එක් ප්‍රතිලාභියෙකුට රු.15,000 බැගින් ලබා දෙනු ලබයි.

**ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමේ 2015 වර්ෂයේ ලබා දුන් දීමනා විස්තර**

| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | සංඛ්‍යාව | ප්‍රතිලාභීන් |
|---|---|---|
| කරච්චි | 120,000 | 08 |
| කණ්ඩාවලෛ | 75,000 | 05 |
| පච්චිලෛපල්ලි | 75,000 | 05 |
| පූනකරි | 75,000 | 05 |
| **එකතුව** | **345,000** | **23** |

## 05) සමාජ මට්ටමේ ආබාධිත පුද්ගලයින් සඳහා දිරිගැන්වීම් වැඩසටහන්

සමාජ මට්ටමේ ආබාධිත පුද්ගලයින් තෝරාගෙන ඔවුන්ගේ අවශ්‍යතාවය මතුකරගෙන කටයුතු කිරීම සඳහා පුහුණු පාඨමාලා පැවැත්වීම.

**ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමේ 2015 වර්ෂයේ ලබා දුන් දීමනා විස්තර**

| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | සංඛ්‍යාව |
|---|---|
| කරච්චි | 25,000 |
| කණ්ඩාවලෛ | 25,000 |
| පච්චිලෛපල්ලි | 25,000 |
| පූනකරි | 25,000 |
| දිස්ත්‍රික් දැනුවත්කිරීම් | 50,000 |
| එකතුව | **125,000** |

## 06) හදිසි අවස්ථා සඳහා සහනාධාර (නිවාස හානි) 2015

හදිසි ආපදාවලින් සිදුවන නිවාස හානි වලට සහනාධාර සඳහා රු.20000 බැගින් චෙක් පත් මගින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ලබා ගැනීම සඳහා පැමිණෙයි.

| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | සංඛ්‍යාව | ප්‍රතිලාභීන් |
|---|---|---|
| කරච්චි | 1,620,000 | 81 |
| කණ්ඩාවලෛ | 940,000 | 47 |
| පච්චිලෛපල්ලි | 60,000 | 3 |
| පූනකරි | 740,000 | 37 |
| එකතුව | **1,056,000** | **168** |

07) දිස්ත්‍රික් සමාජ සේවා කාර්යාලය ගොඩනැගිලි නිර්මාණය කිරීම 3 වන කොටස සම්පූර්ණකිරීමේ වැඩසටහන් සඳහා රු. මිලියන 2 ක ප්‍රතිපාදන වෙන් කොට වියදම් කර තිබේ.

08) කණ්ඩාවලෛ සමාජ සේවා මධ්‍යස්ථාන වැඩසටහන් සඳහා රු. මිලියන 0.65 ප්‍රතිපාදන වෙන් කොට වියදම් කර තිබේ.

## 5.2.7 දිස්ත්‍රික් ක්‍රීඩා සංවර්ධන කටයුතු.

උතුරු පළාත් දිස්ත්‍රික් මට්ටමේ පැවැත් වු තරඟාවලින් කිලිනොච්චි දිස්ත්‍රික් අවසාන අවුරුදු 3 තුළ ඉහළ මට්ටමක ඇති බව පෙනේ.

| අවුරුද්ද | ස්ථානය |
|---|---|
| ❖ 2013 | 5වන ස්ථානය |
| ❖ 2014 | 4වන ස්ථානය |
| ❖ 2015 | 3වන ස්ථානය |

### 2015 වසර උතුරු පළාත් තරඟවලින් කිළිනොච්චි දිස්ත්‍රික්කය ලබා ගත් ප්‍රතිඵල

| ක්‍රීඩා | ස්ථානය |
|---|---|
| 1) කරාතේ කාන්තා | සම පළමු ස්ථාන |
| 2) තෛකොන්ඩෝ | 1 වන ස්ථානය |
| 3) වෙරළ අත්පන්දු කාන්තා | 1 වන ස්ථානය |
| 4) යූඩෝ කාන්තා | 1 වන ස්ථානය |
| 5) වේගයෙන් ඇවිදීමේ තරඟය | 1 වන ස්ථානය |
| 6) පාපන්දු කාන්තා | 2 වන ස්ථානය |
| 7) එල්ලේ කාන්තා | 2 වන ස්ථානය |
| 8) අත්පන්දු කාන්තා | 2 වන ස්ථානය |
| 9) මළල ක්‍රීඩා කාන්තා | 3 වන ස්ථානය |

මළල ක්‍රීඩා සඳහා ලබාගත් පදක්කම් එකතුව :- රන් පදක්කම් - 01, රිදී පදක්කම් - 09, ලෝකඩ පදක්කම් - 11 යනාදිය උතුරු පළාත් තරඟවලින් ලබා ගෙන ඇත.

2015 වසර ජාතික 64Kg බොක්ෂින් තරඟ වලින් වට්ට්‍රාලියස් නීකිලස් මයා 3වන ස්ථානය ලබාගත්තේය.

### ජාතික කණිෂ්ඨ මළල ක්‍රීඩා තරඟාවලිය - 2015

- ❖ ඩෙන්සිකා දේවරායන් මෙනවිය මීටර් 800 තරඟයෙන් 1 වෙනි ස්ථානය ලබා ගත්තාය.
- ❖ සුගිර්දා යෝගනාදන් මෙනවිය උස පැනීමේ තරඟයෙන් 3 වෙනි ස්ථානය ලබා ගත්තාය.

**උතුරු පළාත් මැරතන් තරඟාවලිය**

දේවරායන් ඩෙල්මන් මයා, ඩෙන්සිකා දේවරායන් මෙනවිය යන සහෝදරයන් 1වන ස්ථානය ලබා ගත් බැවින් උතුරු පළාත් නව වාර්තාවක් පිහිටුවා කිලිනොච්චි දිස්ත්‍රික්කයට කීර්තියක් අත්කර දී තිබේ.

**කිලිනොච්චි දිස්ත්‍රික්කයේ පළවන ස්ථාන තුන ලබා ගත් ප්‍රදේශ.**

- 1 වන කරච්චි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
- 2 වන පූනකරි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
- 3 වන පලෛ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

## 5.3 දිස්ත්‍රික් සංවර්ධන කටයුතු.

### 5.3.1 දිස්ත්‍රික් සැළසුම් කටයුතු.

කිලිනොච්චි දිස්ත්‍රික් සැළසුම් ලේකම් අපගේ දිස්ත්‍රික් සංවර්ධනය ඉදිරියට ගෙන යාමේ දී දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සමඟ කරච්චි, කණ්ඩාවලෛ, පූනකරි, පච්චිලෛපල්ලි වන ප්‍රාදේශීය ලේකම් හතර ද එක්ව කටයුතු කරමින් මෙවැනි 2015 වසරේ පැවතුන ප්‍රධාන වැඩසටහන් පහත සඳහන් පරිදි වේ.

### 1. නිවාස සංවර්ධන කමිටු රැස්වීම

ඉන්දීය රජයේ මුදල් උපකාරය යටතේ නිර්මාණය කරන ලද  නිවාස 50000කින් කිලිනොච්චි දිස්ත්‍රික්කයේ අලුත් නිවාස 9215ක් නිර්මාණය කොට ඇත. මේ නිවාස ව්‍යාපෘතිය ඇතුළුව අනෙකුත් නිවාස ව්‍යාපෘති උපකාර සමඟත් අලුත් නිවාස 18504ක් නිර්මාණය කළ අතර නිවාස 4529ක් අලුත්වැඩියා කළහ. තවද අලුත් නිවාස 1149ක වැඩමුළු, නිවාස 19ක අලුත්වැඩියා වැඩමුළු ද ක්‍රියාත්මක වෙමින් පවතී.

තවද දිස්ත්‍රික් නිවාස සංවර්ධන කමිටු රැස්වීම්, දිස්ත්‍රික්  සැළසුම් ලේකම් කාර්යාල සංවිධානය කර ඇත. මෙම රැස්වීමේ දිස්ත්‍රික් නිවාස නිර්මාණය කිරීම සඳහා සහභාගී වී රජය හා රාජ්‍ය නොවන ආයතන එක්ව මෙම ප්‍රගති කටයුතු සම්බන්ධව පරීක්ෂණ පවත්වා ඇත.

### 2. නැවත පදිංචිකිරීම්, විශාල හානි සිදු වූවන්හට දීමනා (එම්.ජ්.බී.)

කිලිනොච්චි දිස්ත්‍රික්කයේ පසු වූ කාලවකවානුව තුළ සිදු වූ ආපදා තත්ත්වයේ දී විශාල හානි සිදු වූවන් හට ආධාර ලබා දෙන බැවින් 202ක ප්‍රතිලාභීන්ගේ විස්තර ලිපිගොණු සාදා පුනරුත්ථාපන අධිකාර සභාව වෙත 2015 වසරේ දී යවන ලද තොරතුරු පහත සඳහන් වේ.

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ | ප්‍රතිලාභීන් |
|---|---|
| 1) කරච්චි | 81 |
| 2) කණ්ඩාවලෛ | 43 |
| 3) පූනකරි | 60 |
| 3) පච්චිලෛපල්ලි | 18 |
| එකතුව | 202 |

## 3. ජලය හා සෞඛ්‍ය පහසුකම් සැපයීමේ සැළසුම් නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශය - 2015

නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශය මඟින් ජලය හා සෞඛ්‍ය පහසුකම් සැපයීමේ සැළසුම් යටතේ කිලිනොච්චි දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල හතරට ළිං හෑරීම සඳහා මිලියන 1.4 ක්, වැසිකිළි සෑදීම සඳහා මිලියන 16.5 මුදල් ප්‍රතිපාදන වෙන් කර ලබාගත්හ. මෙම සැළසුම් මඟින් මෙම දිස්ත්‍රික් ජල හා සෞඛ්‍ය පහසුකම් අවශ්‍යතාවයේ එක කොටසක් සම්පූර්ණ කොට ඇත. මේ සැළසුම් විස්තර පහත සඳහන් වේ.

| අනු අංකය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | ලබා දුන් වැසිකිළි | මුදල් ප්‍රතිපාදන | ලබා දුන් ළිං | මුදල් ප්‍රතිපාදන |
|---|---|---|---|---|---|
| 1 | පූනකරි | 73 | 3.675 | 2 | 0.343 |
| 2 | පච්චිලෛපල්ලි | 30 | 0.510 | 0 | 0 |
| 3 | කරච්චි | 135 | 6.797 | 2 | 0.746 |
| 4 | කණ්ඩාවලෛ | 91 | 4.581 | 1 | 0.315 |
| එකතුව | | **329** | **16.563** | **5** | **1.405** |

### නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශයේ වෙනත් ව්‍යාපෘති

| අනු අංකය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | ව්‍යාපෘති | මුදල (රු.) |
|---|---|---|---|
| 1 | කණ්ඩාවලෙ | ග්‍රාම සංවර්ධන ව්‍යාපෘති | 4.30 |
| 2 | පූනකරි | ග්‍රාම සංවර්ධන ව්‍යාපෘති | 0.70 |
| 3 | පච්චිලෙපල්ලි | නැවත පදිංචි කිරීමේ ආධාර ලබා දීම | 2.78 |
| එකතුව | | | 7.78 |

## 4. කෘෂිකර්ම සංවර්ධනය සම්බන්ධව ව්‍යාපෘති දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටු රැස්වීම්.

කිලිනොච්චි දිස්ත්‍රික්කයේ පැවැත් වූ සියලුම කෘෂිකර්ම කටයුතු සම්බන්ධව තීරණ ගෙන එම කටයුතු සඳහා දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටු රැස්වීම දිස්ත්‍රික් සැළසුම් ලේකම් විසින් ක්‍රියාත්මක කළහ. එම නිසා 2015 වසරේ 26.02.2015, 26.05.2015, 15.10.2015, 07.12.2015 වන දිනයන්හිදී වගා කිරීම්, කෘෂිකර්ම කමිටු රැස්වීම් පවත්වාගෙන කෘෂිකර්ම කටයුතු සම්බන්ධව තීරණ ගෙන ක්‍රියාත්මක කළහ.

ඉහත රැස්වීමේ ආහාර, පාරිභෝගික ආරක්ෂාව සම්බන්ධව අවධානය යොමු කොට එය ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රම සැළසුම් කර ඇත. තවද අදාල වසරේ අගබාගයේ සිට වැදගත් වූ ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන් සම්බන්ධව අවධානය යොමු කර 2016 දී දීර්ඝ කටයුතු සඳහා භාර දී ඇත.

### ආර්ථික මධ්‍යස්ථාන - කිලිනොච්චිය

උතුරු පළාතේ කෘෂිකර්ම නිෂ්පාදන භාණ්ඩ ව්‍යාපාර සඳහා වැදගත් මූලස්ථානය කනගපුරම් තුළ ඉදි කොට ඇති ආර්ථික මධ්‍යස්ථනය බව පෙනේ. මෙම මධ්‍යස්ථානයට සම්පූර්ණ වැඩමුළු අවසන් තත්ත්වයේ ඇති බව හඳුනාගෙන ඉතුරු පහත වැඩකටයුතු ප්‍රතිපාදන ලබා ගත් බැවින් එම වැඩකටයුතු නිම කොට ඇත.

| වැඩකටයුතු විස්තර | ලබා ගත් මුදල් (මිලියන) |
|---|---|
| 1. අභ්‍යන්තර පාර | 6.60 |
| 2. වතුර ටැංකි, ජල නිකුත් කිරීම | 1.60 |
| 3. වැට සැකසීම | 2.76 |
| 4. විදුලි සැපයීම | 0.1 |
| 5. නළ ළිං | 1.14 |
| එකතුව | 12.21 |



## 5. ‘ ගෙයින් ගෙට ගමින් ගමට’ සංවර්ධන ව්‍යාපෘතිය

කිලිනොච්චි දිස්ත්‍රක්කයේ ගෙයින් ගෙට ගමින් ගමට ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා 2015 වසරේ සමාජසේවා හා සුබසාධන අමාත්‍යාංශය විසින් රු. මිලියන 95 ක මුදල් ප්‍රතිපාදන පළමුවන වතාව නිදහස් කරන ලද අතර තවත් රු.මිලියන 11ක් එම වැය ශීර්ෂ යටතේ විශේෂ ප්‍රතිපාදන ලෙස නිදහස් කර සංවර්ධන ව්‍යාපෘතිය ඉදිරියට ගියේය. මෙම ව්‍යාපෘතිය මාර්ග සංවර්ධනය, කුඩා පාලම් සැදීම, ජල බෙදා හැරීම හා කුඩා කානු සංවර්ධනය, සෞඛ්‍ය පහසුකම් සැපයීම පාසල්වල අභ්‍යන්තරය නිර්මාණ කිරීම, ජීවනාධාර සඳහා අභ්‍යන්තර නිර්මාණ පහසුකම් ඇති කිරීම, පොදු ශාලාව, බහු කාර්ය ශාලා, සංස්කෘතික මධ්‍යස්ථාන වන සේවා මධ්‍යස්ථානවලට ගොඩනැගිලි නිර්මාණය කිරීම, ක්‍රීඩා පිට්ටනි සකස් කිරීම, සොහොන්පිටි සකස්කිරීම වැනි සමාජ සේවා ව්‍යාපෘති කිලිනොච්චි දිස්ත්‍රික්කයේ කරච්චි, කණ්ඩාවලෙ, පූනකරි, පච්චිලෙපල්ලි වන ප්‍රාදේශීය ලේකම් කාර්යාල ක්‍රියාත්මක කර ඇත.

**‘ ගෙයින් ගෙට ගමින් ගමට’ ව්‍යාපෘතිය යටතේ කොටස් මට්ටමෙන් ක්‍රියාත්මක කළ මුදල් ප්‍රතිපාදන සම්බන්ධ විස්තර**

| අනු අංක | කොටස් | ව්‍යාපෘති ගණන | වෙන් කළ මුදල් එකතුව (රු. මිලියන) |
|---|---|---|---|
| 1 | මාර්ග සංවර්ධන (පාරවල්, කුඩා පාලම්, කානු) | 36 | 32.825 |
| 2 | ජීවනාධාර සම්බන්ධ අභ්‍යන්තර නිර්මාණ පහසුකම් | 8 | 7.75 |
| 3 | අධ්‍යාපන සංවර්ධනය | 20 | 16.55 |
| 4 | සෞඛ්‍ය සංවර්ධන | 10 | 10 |
| 5 | ජල බෙදාහැරීම් (කුඩා වැව් , කානු අලුත්වැඩියාව ) | 8 | 4.9 |
| 6 | සමාජ අභ්‍යන්තර නිර්මාණ පහසුකම් ඇති කිරීම (ප්‍රජා ශාලා, පුස්තකාල) | 43 | 33.975 |
| **එකතුව** | | **125** | **106.00** |

## ' ගෙයින් ගෙට ගමින් ගමට' – 15000 ගම්මාන පුනරුත්ථාපනය කිරීමේ වැඩසටහන්.

ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමෙන් සකස් කළ ප්‍රතිපාදන සම්බන්ධ විස්තර

| අනු අංකය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | මුදල (රු.) |
|---|---|---|
| 1 | කරච්චි | 46.20 |
| 2 | කණ්ඩාවලෙ | 18.30 |
| 3 | පූනකරි | 21.50 |
| 4 | පච්චිලෛපල්ලි | 20.00 |
| එකතුව | | **106.00** |

